මෙහි '**තෆ්හීම්**' හෙවත් ශබ්දය රළු කිරීමෙහි ද '**තර්කීක්**' හෙවත් අක්ෂර සැහැල්ලුවෙන් උච්චාරණය කිරීමෙහි ද '**ඉමාලා**' හෙවත් කෙටි ප්‍රාණාක්ෂරයන්හි ශබ්දය ඇල කර පාරායනය කිරීමෙහි ද '**මද්**' හෙවත් දීර්ග කිරීමෙහි ද '**කස්ර්**' හෙවත් කෙටි කිරීමෙහි ද '**හම්zස්**' හෙවත් **හම්zසා**(أ) නම් අක්ෂරය සමග ඇතුළත් කිරීමෙහි ද '**ඉල්හාර්**' හෙවත් පැහැදිලි උච්චාරණය කිරීමෙහි ද '**ඉද්ගාම්**' හෙවත් සමාග්‍රහණය කිරීමෙහි ද වෙනස් වීම් අන්තර්ගත වේ. මෙයින් අදහස් වන්නේ එහි මුල් පදයෙහි වෙනස් කමක් ඇති නොවන අතර එහි උච්චාරණ ක්‍රමයෙහි පමණක් වෙනස් කමක් සිදුවේ යන්නයි. උදාහරණ ලෙස එක් පාරායන ක්‍රමයක '**මූසා**' යනුවෙන් පාරායනය කරනු ලබන පදය තවත් පාරායන ක්‍රමයක '**මූසේ**' යනුවෙන් එහි අවසාන කෙටි ප්‍රාණාක්ෂර ශබ්දය ඇල කර පාරායනය කරනු ලැබ ඇත.

කෙසේ වෙතත් ඇතැම් **කිරාඅත**යන් හෙවත් පාරායන ක්‍රමයන් පහළ වූයේ ඉහත සඳහන් වෙනස් වීම් සම්මත කර ගෙනය. ඇත්තෙන්ම මෙම වෙනස් වීම් අතර අදහසෙහි කිසිඳු වෙනස්කමක් ඇති වී නැත. මෙම ක්‍රමවේදය දෙනු ලැබ ඇත්තේ කියවීමේ පහසුව මුල් කොට ගෙනය.

ආරම්භ කාලයේ දී ජනයින් **අල් කුර්ආනය** පහළ වූ ශෛලියට අනුව පාරායනය කිරීමට පුරුදු වී නොසිටියෝය. එබැවින් ඇතැම් පාරායන ක්‍රමයන් ඉහත සඳහන් කරුණු හතට අනුව පාරායනය කිරීමට අනුමැතිය දෙනු ලැබ තිබුණි.

තෙවන **කලීෆා*** වන **උස්මාන්** ﵁ තුමාණන් **අල් කුර්ආනය** පාරායනය කිරීම විෂයෙහි ඇති වූ වැරදි වැටහීම් ඉවත් කරනු පිණිස තම පාලන කාලය තුළ **අල් කුර්ආන**යේ පිටපත් හතක් සකස් කළේය. තවද එතුමා මෙම පිටපත් හතෙහි ඇති අක්ෂර ස්වරූපයෙහි බොහෝ පාරායන ක්‍රමයන් අන්තර්ගත කළේය. අරාබි භාෂාවට විශේෂිත වූ පිල්ලම් හා තිත් වැනි යෙදුම් එම පිටපත්හි නොයෙදූහ. මන්දයත් ඕනෑම කෙනෙකුට ඒවා අතුරින් තමන් කැමති **කිරාඅත**යට* අනුව පරායනය කිරීමට හැකිවනු පිණිසය. කිනම් පාරායන ක්‍රමයන් මෙම පිටපත්හි ඇති අක්ෂර ස්වරූපයෙහි අන්තර්ගත කළ නොහැක්කේද ඒවා ආරක්ෂා කිරීම පිණිස එතුමාණන් එක් එක් පාරායන ක්‍රමයට අනුව එක් එක් පිටපත් සකස් කර තැබුවේය. මෙම පිටපත්හි එක්රැස් කරනු ලැබූ පාරායන ක්‍රමයන් ජනයින් සිත්හි ධාරණය කර ගැනීම පිණිස පාරායන ක්‍රමයේ දැනුම තනි ක්ෂේත්‍රයක් වන තරමට



For instance وَجَاءَتْ سَكْرَةُ الْمَوْتِ بِالْحَقِّ and وَجَاءَتْ سَكْرَةُ الْحَقِّ بِالْمَوْتِ .

6. The difference caused by transposition: This happens when a word found in one reading is replaced by another word in another reading. For instance, نُنْشِزُهَا and نَنْشُرُهَا , also فَتَبَيَّنُوا and فَتَثَبَّتُوا , and طَلْحٍ and طلع .

7. The difference caused by manners of reading: It includes variations in *tafkhīm* (velarization, making sound heavy), *tarqīq* (making a letter sound soft), *imālah* (inclination, bending the sound of a short vowel), *madd* (prolongation), *qasr* (to shorten), *hamz*: *hamza*tation (providing a letter with *hamzah*), *iẓhār* (clear pronunciation) and *idghām* (assimilation). It means that, by doing these, the actual word does not change but the mode of its pronunciation does change. For instance, the word, مُوسٰى is rendered as مُوسٰى in one of the readings.

Anyhow, many readings were revealed incorporating these seven types of different renderings. This difference between them really made no difference in meaning. The latitude so given was aimed at making recitation easy.

In the beginning, people were not totally used to the style of the Qur'ān, therefore, many readings were permitted within the radius of these seven types. But, it was the blessed practice of the Holy Prophet صلى الله عليه وسلم that he would go through the entire revealed Qur'ān with Jibrā'īl عليه السلام during the month of Ramaḍān every year. The year he left this mortal world, that was the year he did so twice. This '*daur*' or meticulous re-reading of the Qur'ān is called العرضة الأخيرة (last review). On this occasion, many readings were abrogated. Only readings retained were the ones which continue to stay preserved to this day with uninterrupted succession.

Sayyidnā 'Uthman رضى الله عنه , during the period of his *khilafah*, arranged to have seven copies of the noble Qur'ān prepared in order to remove misgivings regarding the recitation of Qur'ān. He incorporated all readings in these seven copies by leaving the calligraphed verses of the noble Qur'ān without dots and desinences (the vowel-points) so that the text could be read in accordance with whichever reading one wished to follow from among the very readings cited. Thus most of the



ඒ පිළිබඳව අවධානය යොමු කළේය. තවද බොහෝ විද්වතුන්, **කාරි**වරුන් හා **හාෆිල්**වරුන් හෙවත් **අල් කුර්ආන**ය ධාරණය කළවුන් මේවා ආරක්ෂා කිරීම පිණිස තමන්ගේ ජීවිත කැප කර ඇත.

ඇත්තෙන්ම සිදුවූයේ කුමක් දැ'යි යන්න අවධානය යොමු කළේ නම් **උස්මාන්** ؓ තුමා එම පිටපත් සත විවිධ ප්‍රදේශයන් වලට යවා ඒ සමගම ඒවා නිසි ලෙස පාරායනය කිරීමට උගන්වන **කාරී**වරුන් හෙවත් **අල් කුර්ආන**ය පාරායනය කිරීමෙහි මනා නිපුනත්වයක් ඇත්තන්ව ද යැව්වේය. එම **කාරී**වරුන් ඔවුන්ට අයත් ප්‍රදේශයන්ට ගොස් ඔවුන්ට අයත් **කිරාඅත්** හෙවත් පාරායන ක්‍රමය එම ප්‍රදේශවාසීන්ට ඉගැන්වූවෝය. එබැවින් ජනයින් අතර මෙම විවිධ **කිරාඅත්** හෙවත් පාරායන ක්‍රමයන් පැතිරෙන්නට විය. මෙම අවස්ථාවේදී ඇතැම් මිනිසුන් මෙම විවිධ **කිරාඅත්** ක්‍රම ඉගෙන ගෙන ඒවා අන් අයට ඉගැන්වීමට තම ජීවිතය කැප කළෝය. මෙලෙස **අල් කුර්ආන**ය විවිධ **කිරාඅත**යන් මගින් පාරායනය කිරීමේ ශාස්ත්‍රය ආරම්භ විය. තවද ඇතැම් ඉස්ලාමීය රටවල්වල මිනිසුන් මෙම විෂයෙහි උසස් අධ්‍යාපනය හදාරා නිපුනත්වයක් ලැබූහ. සමහරුන් එක් **කිරාඅත**යක් ද තවත් සමහරුන් **කිරාඅත**යන් දෙකක් ද තවත් සමහරුන් **කිරාඅත**යන් හතක් ද තවත් සමහරුන් එයට වඩා වැඩි **කිරාඅත**යන් ද සිත්හි ධාරණය කළෝය. මේ හා සම්බන්ධව මුළු මුස්ලිම් ප්‍රජාවටම සම්මත නීතියක් පිළිගනු ලැබූ අතර එය සෑම ප්‍රදේශයකම නිසි පරිදි අනුගමනය කරනු ලැබීය. එම නීතියෙහි කොන්දේසි තුනක් පරිපූර්ණ විය යුතු යැයි එම **කාරී**වරුන් නියම කරනු ලැබීය.

1. **උස්මාන්** ؓ තුමාගේ පිටපතට අනුකූල **උස්මානී** ලෙස එම **කිරාඅත්** හෙවත් පාරායන ක්‍රමය විය යුතුය.
2. එය අරාබි ව්‍යාකරණ මාලාවට එකඟ විය යුතුය.
3. එය **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගෙන් පැමිණි බවට තහවුරු විය යුතුය. තවද එය **අල් කුර්ආන**යේ පාරායන ක්‍රමයන් පිළිබඳව නිපුනත්වයක් ලැබූවන් අතර එය ප්‍රකට වූවක් විය යුතුය.

එක් පාරායන ක්‍රමයකට මෙම කොනේදේසි තුනෙන් එකක් හෝ නොතිබුණේ නම් එය **අල් කුර්ආන**යේ කොටසක් යැයි සළකනු නොලැබේ. මේ අනුව බොහෝ **කිරාඅත**යන් හෙවත් පාරායන ක්‍රමයන් **මුතවාතිර්*** ලෙස **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ සමයේ සිට බහුතර පිරිසක් මගින් නොකඩවා දන්වනු ලැබ ඇත. පසු කලෙක යම් **ඉමාම්**වරයෙක් හෝ **කාරි**වරයෙක් ජනයාගේ පහසුව තකා එක් **කිරාඅත**යක් හෝ **කිරාඅත**යන් කිහිපයක් පමණක් ජනයාට ඉගැන්වීමට පටන් ගත්තේ නම් එසේ ඔහු ඉගැන්වූ නිශ්චිත **කිරාඅත**යන් හඳුන්වනු ලැබුවේ එම **ඉමාම්**වරයාගේ නාමයෙනි. ඉන් පසුව විද්වතුන් මෙම **කිරාඅත**යන් එක්රැස් කිරීමට පොත් පත් ගොනු කරන්නට පටන් ගත්තෝය. ඒ අනුව මුලින්ම මෙම ක්ෂේත්‍රයේ ග්‍රන්ථයන් සම්පාදනය කළේ **ඉමාම් අබූ උබෙයිද් කාසිම් ඉබ්නු සල්ලාම්**, **ඉමාම් අබූ හාතිම් සජිස්තානී**, **කාලි ඉස්මාඊල්** හා **ඉමාම් අබූ ජඃෆර් අත් තබරී** යන අයයි. ඒවායෙහි **කිරාඅත**යන් හෙවත් පාරායන ක්‍රමයන් 20ට අධිකව අන්තර්ගත වී තිබුණි. පසුව **අබූ බක්ර් ඉබ්නු මුජාහිද්** (අභාවය, **හිජ්රී** 324) යන ශ්‍රේෂ්ට විද්වතා

What actually happened was that when Sayyidnā ʻUthman رضى الله عنه sent the seven copies of the noble Qur'ān to various areas, he had also sent particular reciters who could teach how to recite them. So, when these revered reciters reached their designated areas, they taught people to read the Qur'ān in accordance with their respective readings. These different readings spread out among people. At this stage, some people bequeathed their lives to memorize different readings, and in training others to continue the discipline. This is how the foundation of the 'science of readings' was laid and people from different parts of the Islamic world started turning to the masters of the discipline to achieve the highest of excellence in it. Some memorized only one reading, others did two or three or seven, or even more than that. In this connection, a standard rule was accepted as norm throughout the *ummah* and it was invariably followed everywhere. It stipulated that only such reading (*qirā'ah*) will be accepted as being the Qur'ān which fulfils three conditions:

1. There is room for it in the script of ʻUthmani' copies of the Qur'ān.
2. It conforms to the grammar of the Arabic language.
3. It should have, provenly -- with sound authority, originated from the Holy Prophet صلى الله عليه وسلم, and be well-known among the masters of readings, that is, the Imāms of Qirā'ah.

A reading which lacks even one of these three requirements cannot be considered as part of the Qur'ān. Thus a large number of readings continued to be reported in uninterrupted succession. Then, as a matter of convenience, it so happened that an Imām started giving instructions in one, or some selected readings, and that particular reading became identified with his name. Then, scholars started writing books to collect these readings. So, Imam Abu ʻUbayd Qāsim ibn Sallām, Imām Abū Ḥātim Sijistānī, Qāḍī Ismāʻīl and Imām Abū Jaʻfar al-Ṭabarī were the first among those who compiled books in this field which included more than twenty readings. Then came the great scholar, Abū Bakr ibn Mujāhid (died 324 Hijrah) who wrote a book in

කාරිවරුන් හත්දෙනා

ඉමාම් අබූ බක්ර් ඉබ්නු මුජාහිද් යන විද්වතාගේ ග්‍රන්ථය මගින් ජනප්‍රිය වූ **කාරි**වරුන් හත්දෙනා :

1. **අබ්දුල්ලාහ් ඉබ්නු කසීර් අද් දාරී** (අභාවය, **හිජ්රි** 120) තුමාණන් **අනස් ඉබ්නු මාලික්** ؓ තුමාණන්, **අබ්දුල්ලාහ් ඉබ්නු zසුබෙයිර්** ؓ තුමාණන් හා **අබූ අයියූබ් අල් අන්සාරී** ؓ තුමාණන් යන **සහාබි**වරුන්ව* හමු වී ඔවුන්ගෙන් දැනුම හැදෑරූ විද්වතෙකි. ඔහුගේ **කිරාඅතය** හෙවත් පාරායන ක්‍රමය **මක්කා**වේ ජනප්‍රිය විය.

ඉමාම් බzස්zසී තුමාණන් හා **ඉමාම් කම්බල්** තුමාණන් යන විද්වතුන් එතුමාගෙන් වාර්තා කළ ප්‍රකට විද්වතුන්ය.

2. **නාෆිඃ ඉබ්නු අබ්දුර් රහ්මාන් ඉබ්නු අබී අන් නුඅයිම්** (අභාවය, **හිජ්රි** 169) තුමාණන්, මොහු **සහාබි**වරුන් වන **උබෙයි ඉබ්නු කඃබ්** ؓ තුමාණන්, **අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස්** ؓ තුමාණන් හා **අබූ හුරෙයිරා** ؓ තුමාණන් යන අයගේ ශිෂ්‍යයන් වන **තාබිඃ**වරුන් හැත්තෑ දෙනෙකුගෙන් දැනුම හැදෑරූ විද්වතෙකි. එතුමාගේ **කිරාඅතය** හෙවත් පාරායන ක්‍රමය **මදීනා**වෙහි ප්‍රසිද්ධ වී තිබුණි. **අබූ මූසා කාලූන්** (අභාවය, **හිජ්රි** 220) තුමාණන් හා **අබූ සඊද්** (අභාවය, **හිජ්රි** 197) තුමාණන් එතුමාගෙන් වාර්තා කළ සුප්‍රකට විද්වතුන්ය.

3. **ඉබ්නු ආමිර්** නමින් ප්‍රකට **අබ්දුල්ලාහ් අල් හිස්බී** (අභාවය, **හිජ්රි** 118) මොහු **නුඃමාන් ඉබ්නු බෂීර්** ؓ තුමාණන් හා **වාසිලා ඉබ්නු අස්කා** ؓ තුමාණන් යන **සහාබි**වරුන්ව* හමු වී ඔවුන්ගෙන් දැනුම හැදෑරූ විද්වතෙකි. තවද මොහු **උස්මාන්** ؓ තුමාණන්ගේ ශිෂ්‍යයා වන **මුගීරා ඉබ්නු ෂිහාබ්** තුමාණන්ගෙන් **කිරාඅත්** කලාව ඉගෙන ගත්තේය. මොහුගේ **කිරාඅතය** බොහෝ ලෙස භාවිත වූයේ සිරියාවෙහිය. **හිෂාම්** තුමාණන් හා **දක්වාන්** තුමාණන් යන විද්වතුන් එතුමාගෙන් වාර්තා කළ සුප්‍රකට විද්වතුන්ය.

4. **අබූ අම්ර් zසබ්බාන් ඉබ්නු අල් අලා** (අභාවය, **හිජ්රි** 154), මොහු **මුජාහිද්** හා **සඊද් ඉබ්නු ජුබෙයිර්** තුමන්ගේ පෙළෙන් **ඉබ්නු අබ්බාස්** හා **උබෙයි ඉබ්නු කඃබ්** ؓ තුමාණන් යන **සහාබි**වරුන් දෙදෙනාගෙන් වාර්තා කර ඇත. මොහුගේ **කිරාඅතය** **බස්රා** නම් ප්‍රදේශයේ සුප්‍රසිද්ධ විය. **අබූ උමර් අද් දව්රී** (අභාවය, **හිජ්රි** 246) හා **අබූ ෂුඅයිබ් අස් සූසී** (අභාවය, **හිජ්රි** 261) යන විද්වතුන් එතුමාගෙන් වාර්තා කළ සුප්‍රකට විද්වතුන්ය.

5. **ඉක්රිමා ඉබ්නු රබීඃ අත් තයිමි**ගේ වහලෙකු වූ **හම්zසා ඉබ්නු හබීබ් අzස් zසයියාත්** (අභාවය, **හිජ්රි** 188) මොහු **උස්මාන්, අලි** හා **අබ්දුල්ලාහ් ඉබ්නු මස්උඃද්** ؓ යන **සහාබි**වරුන්ගෙන් දැනුම හැදෑරූ **zසිර් ඉබ්නු හුබෙයිෂ්**ගේ ශිෂ්‍යයා වන **යහ්යා ඉබ්නු වස්සාබ්**ගේ ශිෂ්‍යයා වන **සුලෙයිමාන් අල් අඃමෂ්**ගේ ශිෂ්‍යයෙකු විය. **හලෆ් ඉබ්නු හිෂාම්** (අභාවය, **හිජ්රි** 188) හා **හල්ලාද් ඉබ්නු කාලිද්** (අභාවය, **හිජ්රි** 220) එතුමාගෙන් වාර්තා කළ ප්‍රකට විද්වතුන්ය.



The Seven Qārīs

Anyhow, the seven *qāris* who became most famous as a result of this act of ‘Allāmah ibn Mujāhid are:

1. ‘Abdullah ibn Kathīr al-Darī (died 120 Hijrah). He was fortunate enough to have seen Sayyidnā Anas ibn Mālik, ‘Abdullāh ibn Zubayr and Abu Ayyūb al-Ansārī رضى الله عنهم from among the Companions. His reading became more famous in Makkah al-Mukarramah. Well-known among those who transmitted his rendition are Bazzī and Qambal, may Allah have mercy on them all.

2. Nafi‘ ibn ‘Abd Al-Rahmān ibn Abī al-Nu‘aym (died 169 Hijrah). He had the benefit of learning from seventy successors to the Companions who were direct disciples of Sayyidnā ’Ubayy ibn Ka‘b, ‘Abdullāh ibn ‘Abbās and Abū Hurayrah رضى الله عنهم . His reading became more famous in Madīnah and among those who transmitted his rendition, Abū Mūsā Qālūn (died 220 Hijrah) and Abu Sa‘īd Warsh (died 197 Hijrah) are better known.

3. ‘Abdullāh al-Hisbī, better known as Ibn ‘Āmir (died 118 Hijrah). He was fortunate to have seen Sayyidnā Nu‘mān ibn Bashīr and Wāthilah ibn Asqā’ رضى الله عنهم from among the Companions. He had learnt the art of Qur’ānic reading from Mughīrah ibn Shihāb al-Makhzūmī who was a disciple of Sayyidnā ‘Uthmān رضى الله عنه . His reading gained currency mostly in Syria, and more famous among those who transmitted his rendition are Hishām and Dhakwān.

4. Abū ‘Amr Zabbān ibn al-‘Alā (died 154 Hijrah). He has reported his rendition from Sayyidnā Ibn ‘Abbās and ’Ubayy ibn Ka‘b رضى الله عنهم through *Mujāhid* and Sa‘id ibn Jubayr. His reading became fairly well-known in Basrah. Abū ‘Umar al-Dawrī (died 246 Hijrah) and Abū Shu‘ayb al-Sūsī (died 261 Hijrah) are among the more famous transmitters of his rendition.

5. Hamzah ibn Ḥabīb al-Zayyāt, ex-slave of ‘Ikramah ibn Rabī‘ al-Taymī (died 188 Hijrah). He is a disciple of Sulayman al-A‘mash, who was a disciple of Yahyā ibn Waththāb, who was a disciple of Zirr ibn Ḥubaysh, and he had the benefit of learning from Sayyidnā ‘Uthmān, ‘Alī and ‘Abdullāh ibn Mas‘ūd رضى الله عنهم . Among his transmitters, Khalf ibn Hishām (died 188 Hijrah) and Khallād ibn Khālid (died 220 Hijrah) are more famous.

6. **ආසිම් ඉබ්නු අබී අන් නජූද් අල් අසදී** (අභාවය, **හිජ්රි** 127), මොහු **අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද්** ؓ තුමාණන්ගේ ශිෂ්‍යයෙකු වන **zසිර් ඉබ්නු හුබෙයිෂ්**ගෙන් ද **අලි** ؓ තුමාණන්ගේ ශිෂ්‍යයන් වන **අබූ අබ්දුර් රහ්මාන් සුලමී** හා **අල් අසදී** යන අයගෙන් ද දැනුම හැදෑරූ විද්වතෙකි. **ෂුඃබහ් ඉබ්නු අය්යාෂ්** (අභාවය, **හිජ්රි** 193) හා **හෆ්ස් ඉබ්නු සුලෙයිමාන්** (අභාවය, **හිජ්රි** 180) තුමාණන් එතුමාගෙන් වාර්තා කළ ප්‍රකට විද්වතුන්ය. වර්තමානයේ පොදුවේ **අල් කුර්ආනය** පාරායනා කරනු ලබන්නේ ද මෙතුමා වාර්තා කළ **කිරාඅතය**ට අනුවය.

7. **අබූ අල් හසන් අලී ඉබ්නු හම්zසා අල් කිසාඊ** (අභාවය, **හිජ්රි** 189), **අබූ අල් හාරිස් මර්වzසී** (අභාවය, **හිජ්රි** 240) හා **අබූ උමර් අද් දව්රී** (මොහු **අබූ අම්ර්**ගෙන් ද වාර්තා කර ඇත) යන අය එතුමාගෙන් වාර්තා කළ ප්‍රකට විද්වතුන්ය. අවසාන **කිරාඅත්** හෙවත් පාරායන ක්‍රමයන් තුන **කූෆහ්** නම් ප්‍රදේශයේ ප්‍රසිද්ධ විය.

පෙර සඳහන් පරිදි මෙම **කිරාඅත්*** හෙවත් පාරායන ක්‍රම හත නොවන තවත් ක්‍රමයන් කිහිපයක් ද ඇත. ඒවා ද **මුතවාතිර්*** ගණයට අයත් තහවුරු වූ **කිරාඅත**යන් වේ. කෙසේ වෙතත් පෙර සඳහන් **කිරාඅත**යන් හත පමණක් තහවුරු වූ **කිරාඅත**යන් යැයි වරදවා වටහා ගත් අවස්ථාවේ දී **අල්ලාමා ෂදාඊ** හා **අබූ බක්ර් ඉබ්නු මිහ්රාන්** තුමන් වැනි ඇතැම් විද්වතුන් මෙම **කිරාඅත**යන් හත වෙනුවට **කිරාඅත**යන් දහයක් එක් ග්‍රන්ථයක එක්රැස් කළෝය. එබැවින් '**අල් කිරාඅතුල් අෂ්රා**' හෙවත් පාරායන ක්‍රම දහය ප්‍රචලිත විය. මෙම **කිරාඅත**යන් දහයෙහි ඉහත සඳහන් හත සමග පහත් සඳහන් තුන ද අන්තර්ගත වී තිබිණ.

1. **යඃකූබ් ඉබ්නු ඉස්හාක් අල් හල්රමී** (අභාවය, **හිජ්රි** 205) : මොහුගේ **කිරාඅතය බස්රා** නගරයේ ප්‍රසිද්ධ විය.
2. **හල්ෆ් ඉබ්නු හිෂාම්** (අභාවය, **හිජ්රි** 205) : මොහු ද **හම්zසා**ගේ **කිරාඅතය** වාර්තා කළ කෙනෙකි. මොහුගේ **කිරාඅතය කූෆහ්** දේශයෙහි ප්‍රසිද්ධ විය.
3. **අබූ ජඃෆර් යzසීද් ඉබ්නු කඃකා** (අභාවය, **හිජ්රි** 130) : මොහුගේ **කිරාඅත**යට **මදීනා**වෙහි ඉතා උසස් ස්ථානයක් හිමි විය.



6. 'Āṣim ibn Abi al-Najūd al-Asadiyy (died 127 Hijrah). Through Zirr ibn Hubaysh, he is a disciple of 'Abdullāh ibn Mas'ūd رضي الله عنه and through Abū 'Abd al-Rahman Sulami and al-Asadiyy, he is a disciple of Sayyidnā 'Ali رضي الله عنه . More famous among the transmitters of his rendition are Shu'bah ibn 'Ayyāsh (died 193 Hijrah) and Ḥafṣ ibn Sulaymān (died 180 Hijrah). Generally, the recitation of the Holy Qur'ān these days is made following the rendition of this very Ḥafṣ ibn Sulaymān.

7. Abū al-Ḥasan 'Ali ibn Ḥamzah al-Kisā'i (died 189 Hijrah). Among his transmitters, Abū al-Ḥarith Marwazi (died 240 Hijrah) and Abū 'Umar al-Dawri (who is also a transmitter of Abū 'Amr) are better known. The readings of the later three became more common in Kūfah.

As it has been submitted earlier that several other readings, other than these seven, are sound and have been reported in uninterrupted succession. However, when the misunderstanding that sound readings are limited to these seven started gaining currency, several scholars (for example, 'Allāmah Shadhā'i and Abū Bakr ibn Mihrān) collected, instead of seven, ten readings in one book. Thereupon, the term, "*Al-qirā'āt al-'ashrah*" or "Ten Readings" became famous. In these ten readings, the readings by the following three were also included in addition to those of the seven mentioned above:

1. Ya'qūb ibn Isḥāq al-Ḥaḍrami (died 205 Hijrah). His rendition was famous mostly in Baṣrah.
2. Khalf ibn Hishām (died 205 Hijrah) who is also a transmitter of the rendition of Hamzah. His rendition was common mostly in Kūfah.
3. Abū Ja'far Yazid ibn al-Qa'qā' (died 130 Hijrah). His rendition found wider currency in Madinah al-Tayyibah.



වහ කෙටුම්පත් කර ගැනම

අරාබිකයින්ගේ සිරිත් පරිදි **නබි මුහම්මද්** ﷺ තුමාණන් මතකයේ රඳවා ගැනීම සමගම **අල් කුර්ආනය** ලියා තැබීමටද සැලසුම් කර තිබුණි. මේ පිළිබඳව **zසයිද් ඉබ්නු සාබිත්** ؓ තුමාණන් නැමැති **සහාබි**වරයා මෙසේ පවසයි.

"මම **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ උපදෙස් පරිදි **වහී*** නම් දේව පණිවිඩ ලියන්නෙකුව සිටියෙමි. **වහී** පහළ වන විට එහි බැරෑරුම් බවින් එතුමාණන්ගේ නලළ දහදියෙන් තෙත් වී යයි. පසුව මම එතුමාණන් කියවන දෑ ඇට කටුවල හෝ ලෑලි කැබැලිවල කෙටුවෙමි. පසුව වැඩිදුරටත් නිවැරදි කර ගැනීම සඳහා එතුමාණන්ට කියවා පෙන්වන්නෙමි." (**මජ්මඋ අzස් zසවාඉද්, තබරානී** 1:156)

zසයිද් ඉබ්නු සාබිත් ؓ තුමාණන් සමග **කලීෆා**වරුන් සිව් දෙනාද **උබෙයි ඉබ්නු කඃබ්** ؓ තුමාණන්, **zසුබෙයිර් ඉබ්නු අව්වාම්** ؓ තුමාණන්, **මුආවියා** ؓ තුමාණන්, **මුගීරත් ඉබ්නු ෂුඃබා** ؓ තුමාණන්, **කාලිද් ඉබ්නු වලීද්** ؓ තුමාණන්, **සාබිත් ඉබ්නු කයිස්** ؓ තුමාණන්, **අබාන් ඉබ්නු සඊද්** ؓ තුමාණන් යන **සහාබි**වරුන් ද **වහී** කෙටුම්පත් කළ අය අතර වූහ. **වහී** කෙටුම්පත් කිරීම සතුන්ගේ ඇටකටුවල ද සෙල්ලිපි ලෙසින් ද ඉඳි අතුවල ද සටහන් කර තිබුණු අතර මෙසේ ලියා තිබූ කොටස් ක්‍රමවත්ව එක්තැන් නොවී විවිධ පෙදෙස්වල විසිරී තිබුණි. (**ෆත්හුල් බාරී** 9:18)

කලීෆා අබූ බක්ර් ؓ තුමාණන්ගේ පාලන කාලයේ **අල් කුර්ආනය** එක්රැස් කළ යුතු යැයි එතුමා සිතුවේය. එයට තුඩු දුන් ප්‍රධාන හේතුව පිළිබඳව '**කාතිබුල් වහී**' හෙවත් '**වහී** ග්‍රන්ථාරූඪ කරන්නා' යන විරුදාවලියෙන් පිදුම් ලත් **zසයිද් ඉබ්නු සාබිත්** ؓ තුමාණන් මෙසේ විස්තර කරයි.

'**යමාමා** සංග්‍රාමයෙන් පසු **කලීෆා අබූ බක්ර්** ؓ තුමාණන් මා කැඳෙව්වේය. මා එතුමා හමුවීමට ගිය විට **උමර්** ؓ තුමාද එහි සිටියේය. **අබූ බක්ර්** ؓ තුමා මා අමතා **උමර්** ؓ තුමා පැවසූ කරුණක් පිළිබඳව මා දැනුවත් කළේය.

'එනම් **යමාමා** යුද්ධයේදී **අල් කුර්ආනය** සිත්හි ධාරණය කළ බොහෝ '**හාෆිල්**වරු' හෙවත් **අල් කුර්ආනය** හදවතේ මනනය කළවුන් බොහෝ දෙනෙකු



The writing of *Wahy*

Besides having the Qur'ān committed to memory, the Holy Prophet صلى الله عليه وسلم made special arrangements to have the Qur'ān committed to writing as well. Sayyidna Zayd ibn Thābit رضى الله عنه says: 'I used to write down the words of *Waḥy* for him. When *Wahy* came to him he felt burning with heat and the drops of perspiration would start rolling down on his body like pearls. When this state would go away from him, I would present myself before him with a shoulder-bone or a piece (of something else). He would go on dictating and I would go on writing. When I would be finished with writing, the sheer weight of copying the Qur'ān would give me the feeling that my leg is going to break and I would never be able to walk. In any case, when I would be finished with writing, he would say: 'Read'. I would read it back to him. If there was a shortcoming, he would have it corrected and then let it be known to people (Majma' al-Zawaid with reference to Tabrani 1/156).

Introduction 22

Besides Sayyidnā Zayd ibn Thābit رضى الله عنه , there were many other Companions who carried out the duty of committing the *Wahy* to writing. Some of those who can be specially mentioned, in addition to the Four Guided Caliphs, are Sayyidnā 'Ubayy ibn Ka'b, Sayyidnā Zubayr ibn 'Awwām, Sayyidnā Mu'āwiyah, Sayyidnā Mughīrah ibn Shu'bah, Sayyidnā Khālid ibn al-Walid, Sayyidnā Thābit ibn al-Qays, Sayyidnā Abān ibn Sa'id and others (Fath al-Bari, 9/18)

Preservation: In the period of Sayyidnā Abū Bakr رضى الله عنه

However, it was characteristic of all copies of the noble Qur'ān made during the days of the Holy Prophet صلى الله عليه وسلم that they were either written on different available writing surfaces, for instance, a verse would appear on parchment, another on tree leaf and yet another on a bone; or they were not complete copies. One Companion would have only a single Sūrah in his record while someone else would have five or ten Sūrahs and some others will have only a few verses. Then there were Companions having in their possession explanatory sentences as well along with the text of the verses.



1. පළමුව තමාගේ මතකයේ ඇති **අල් කුර්ආනය** සමග ගෙන එන ලද කෙටුම්පත සසඳා බලා තහවුරු කර ගත්තේය.

2. දෙවනුව **උමර්** ؓ තුමා සමග එකතු වී ඔවුන්ගේ මතකයේ තිබෙන **අල් කුර්ආනය** සමග ද සසඳා බලා තහවුරු කර ගත්තේය. (**ෆත්හුල් බාරී, ඉබ්නු අබී දාවුද්**)

---

3. **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ අවදියේ දී පහළ වී කෙටුම්පත් කළ බවට සාක්ෂි දෙකක් ස්ථිර කරන තුරු ඒවා තහවුරු කර නොගත්තේය. (**අල් ඉත්කාන්** 1:10)

4. පසුව ලියා ගත් දෑ හැකි පමණ **සහාබි**වරුන් අතර සිටි **හාෆිල්**වරුන් හමු වී තහවුරු කර ගත්තේය. (**අල් බුර්හාන් ෆී උලූමිල් කුර්ආන්** 1:238)

එබැවින් **zසයිද් ඉබ්නු සාබිත්** ؓ තුමා හැකි පමණින් ප්‍රවේශමෙන් **අල් කුර්ආන් ආයත**යන් එක්රැස් කර පත්‍ර පිටුවල ඒවා සකස් කළේය. නමුත් මෙසේ ග්‍රන්ථ ස්වරූපයට නගනු ලැබූ ප්‍රථම **අල් කුර්ආන**යට "أم" "**උම්**" හෙවත් 'මව' යනුවෙන් නම් කරනු ලැබීය. එහි විශේෂත්වයන් කිහිපයක් විය. එනම්,

1. **ආයතයන් නබි මුහම්මද්** ﷺ තුමාණන් කී පිළිවෙලට යොදමින් පරිච්ඡේද සකස් කර තිබීම. නමුත් වර්තමානයේ පාරායනය කරනු ලබන **අල් කුර්ආන**යේ ඇති පරිච්ඡේද පිළිවෙල එම ග්‍රන්ථයේ එකට සැකසී නොතිබිණ. එනම් සෑම පරිච්ඡේදයක්ම තනි තනිවම සකස් වී තිබිණ.

2. මෙම ග්‍රන්ථය ශෛලීන් 7 ක් අනුව පාරායනය කළ හැකි එකක්ව තිබුණි. (**මන්හලුල් ඉර්ෆාන්** 1:246, **තාරිකුල් කුර්ආන්** 28)

3. පාරායනය නොකළ යුතුව තිබූ المَنْسُوخ **මන්සූඃහ්** හෙවත් අවලංගු කරන ලද සියලුම **ආයත**යන් පවා එකක් නොහැර ලියන ලදී.

4. මෙම පිටපතේ අරමුණ වූයේ මුළු මහත් මුස්ලිම් ජනයාම අනුමත කළා වූ සකස් කරන ලද ලේඛනයක් සූදානම් කිරීමය. එබැවින් කවරෙකුට අවශ්‍යතාවක් ඇත්තේද ඔහුට එමගින් නිර්දේශයක් වෙත යොමු විය හැකව තිබුණි.

මෙම ග්‍රන්ථය පළමුව **කලීෆා අබූ බක්ර්** ؓ තුමා භාරයේ ද පසුව ඔහුගේ අභාවයෙන් පසු **උමර්** ؓ තුමාගේ භාරයේ ද පසුව **හෆ්සා** ؓ තුමිය භාරයේ ද අවසානයේදී **මර්වාන් ඉබ්නුල් හකම්** තුමාණන්ගේ භාරයේ ද පැවතිණ. (**ෆත්හුල් බාරී** 9:16)



(1) To begin with, he tested its reliability against his own memory.

(2) Then, Sayyidnā 'Umar too was a *Ḥafiẓ* of Qur'ān, and as proved by reliable reports, Sayyidnā Abū Bakr رضى الله عنه had assigned him too to work with Sayyidnā Zayd on this project. When someone came with some verse, Sayyidnā Zayd and Sayyidnā 'Umar used to receive it jointly (Fath al-Bari with reference to ibn Abi Dawud).

(3) No written verse was accepted until such time that two trustworthy witnesses had testified to the fact that the particular verse was written in the presence of the Holy Prophet صلى الله عليه وسلم (al-Itqan, 1/10)

(4) After that, these verses in writing were collated with collections that different Companions had prepared for themselves (al-Burhan fi 'Ulum al-Qur'an, by Zarkashi, 1/238).

But, each Surah was written in separate folios, therefore, this copy was composed of many folios. In the terminology of Qur'ānic Studies, this copy is called the "*Umm*" (literally, 'the mother', meaning 'the original') and it had the following features:

1. In this copy, the Qur'ānic verses were indeed arranged in accordance with the order identified by the Holy Prophet صلى الله عليه وسلم, but the Sūrahs were not so arranged, rather they were written separately (Ibid).

2. Incorporated in this copy were all seven *Ḥurūf* (versions) of the Qur'ān (which have been explained earlier). (Manhil al'Irfan, 1/246 and Tarikh al-Qur'an by al-Kurdi, p. 28)

3. Collected here were all verses the recitation of which has not been abrogated.

4. The purpose of having this copy made in writing was to prepare an organized document with the collective endorsement of the whole *ummah*, so that, reference can be made to it when needed.



කලීෆා උස්මාන් ﵁ තුමාගේ වකවානුවේ අල් කුර්ආනය සංරක්ෂණය කළ ආකාරය

තෙවෙනි **කලීෆා*** වන **උස්මාන්** ﵁ තුමාගේ පාලන කාලය තුළ ඉස්ලාම් දහම අරාබි ප්‍රදේශයෙන් ඔබ්බට පැතිරී රෝමය, ඉරානය වැනි '**අජම්**' හෙවත් අරාබි නොවන රාජ්‍යයන්ට පවා විහිදෙන්නට විය. එම රාජ්‍යයන්හි අරාබි නොවන මුස්ලිම්වරුන් එහි පැමිණෙන අරාබි මුස්ලිම් වෙළෙඳුන්ගෙන් ද දහම් ප්‍රචාර කටයුතු සඳහා පැමිණෙන අරාබි මුස්ලිම්වරුන්ගෙන් ද **අල් කුර්ආනය** ඉගෙන ගත්හ.

මේ කාල වකවානුවේදී එසේ උගන්වන අරාබි මුස්ලිම් භක්තිකයින් හා ඒ ඒ ශෛලීන් හිමි වාර්ගිකයින් එය තවත් කෙනෙකුට ඉගැන්වීමේ දී තමාගේ

XXXVII

අල් කුර්ආන් හැඳින්වීම

වී එකම **අල් කුර්ආන්** පිටපතක් වෙනුවෙන් එකඟ වෙමු" යැයි පවසා **හෆ්සා** ﵁ තුමිය භාරයේ තිබුණු මව් ග්‍රන්ථය ලබා එය පිටපත් කිහිපයකට පත් කිරීමට කටයුතු කරමින් ඒ සඳහා මඬුල්ලක් ඇති කළහ. එයට **zසයිද් ඉබ්නු සාබිත්, අබ්දුල්ලාහ් ඉබ්නු zසුබෙයිර්, සඊද් ඉබ්නුල් ආස්, අබ්දුර් රහ්මාන් ඉබ්නු හාරිස් ඉබ්නු හිෂාම්** ﵁ යන **සහාබි**වරුන් ඇතුළත් වූහ. ඔවුන් අතුරින් **zසයිද්** ﵁ තුමාණන් පමණක් **අන්සාරි** හෙවත් **මදීනා** වැසියෙකු වූ අතර සෙසු අය **මක්කා** වැසියන් වූ **කුරෙයිෂ්** ගෝත්‍රිකයින් වූහ. එබැවින් **උස්මාන්** ﵁ තුමා එම සිව්දෙනාට "නුඹලා අතර හා **zසයිද්** තුමාණන් අතර **අල් කුර්ආනය** ලිවීමේ දී වෙනස් කමක් ඇති වූයේ නම් එවිට නුඹලා එය **කුරෙයිෂ්**වරුන්ගේ භාෂාවට අනුව ලියවු. මන්දයත් **අල් කුර්ආනය** පහළ වූයේ ඔවුන්ගේ භාෂාවට අනුව ය. මඬුල්ලට අයත් **සහාබි**වරුන් සිව් දෙනාම සිය කාර්යභාරය පහත අන්දමින් ඉටු කළහ. (ෆත්හුල් බාරි 9 වෙළුම 13-15)

1. **අබූ බක්ර්** ﵁ තුමාගේ සමයෙහි එක්රැස් කළ **අල් කුර්ආනය** වර්තමානයේ තිබෙන **අල් කුර්ආනය** මෙන් පරිච්ඡේද එක් කොට නොතිබුණි. නමුත් මෙම මඬුල්ල එහි පරිච්ඡේද අනුපිළිවෙළට එක්කොට එක් පිටපතකට ගොනු කළෝය. (**මුස්තද්රක්** 2:229)

2. තවද අරාබි භාෂාවට විශේෂිත වූ පිල්ලම් හා තිත් වැනි යෙදුම් නොමැතිව සෑම ශෛලයකටම අනුව කියවීමේ හැකියාව ඇතිව අකුරු පමණක් භාවිත කරමින් ලියූහ.

උදාහරණ වශයෙන් මෙම **අල් කුර්ආනයේ** ඔවුන් ننسرها යැයි ලියා ඇත. එම අරාබි වචනය نُنْشِزُهَا යැයිද نَنْشُرُهَا යැයිද උච්චාරණය කළ හැක. (**මනාහිලුල් ඉර්ෆාන්** 1:253-254)

3. මෙසේ මොවුන් විසින් ලියන ලද **අල් කුර්ආන්** පිටපත් 5 ක් යනුවෙන් හා තවත් වාර්තාවක 7 ක් යනුවෙන්ද සඳහන් වේ. ඒවායින් එකක් **මදීනා**වේ තබා අනෙක් ඒවා **මක්කා**වට ද **සිරියා**වට ද **යෙමන**යට ද **බහ්රේන**යට ද හා **කූෆා**වට ද **බස්රා**වට ද යවන ලදී.



Preservation: In the period of Sayyidnā 'Uthmān رضی اللہ عنہ

When Sayyidnā 'Uthmān رضی اللہ عنہ became Khalifah, Islam had grown out of Arabia reaching into the far-flung areas of Byzantium and Iran. As people from new areas embraced Islam, they would learn the noble Qur'ān from the Mujāhidin of Islam or from the traders because of whom they had found the blessing of Islam. On the other side, you have already read that the noble Qur'ān was revealed incorporating seven versions with various readings, and different *Ṣaḥābah* (Companions) had learnt it from the Holy Prophet ﷺ in accordance with different readings, therefore, every Companion taught

Introduction 29

Basically, this duty was entrusted to only four distinguished persons named above, but later on, other Companions were also attached to help them out. (Fath al-Bari, pp. 13-15, v. 9)

They performed the following functions in connection with the writing of the Qur'ān:

1. In the copy prepared during the period of Sayyidnā Abū Bakr رضی اللہ عنہ, Sūrahs were not placed in sequence, rather each Sūrah was written separately. They wrote down all Sūrahs in their proper sequence in a single copy. (Mustadrak, 2/229)

2. The verses of the noble Qur'ān were written in a way so that all readings backed by uninterrupted succession could be incorporated within their script. Therefore, no dots or desinential marks were placed on them so that the text could be recited in accordance with all readings that are supported by uninterrupted succession. For instance, they wrote ننسرها in order that it could be read both نُنْشِزُهَا and نَنْشُرُهَا, because both readings are correct. (Manahil al- 'Irfan, 1/253-254)

3. Upto this time, there existed only one single copy of the noble Qur'ān - complete, authentically standard and collectively attested by the whole *ummah*. These distinguished persons prepared more than one copy of this newly organized *Muṣḥaf* (copy of the Qur'ān).





4. ඉහත පිටපත් කිරීම සඳහා පෙරදැරි කොට ගනු ලැබුවේ **අබූ බක්ර්** ؓ තුමාගේ කාලයේදී එක්රැස් කරන ලද **'උම්'** නම් වූ මව් පිටපත වූ නමුත් වැඩිදුර ප්‍රවේසම සඳහා එම පළමු පිටපත සඳහා අනුගමනය කරන ලද සියලු නිර්දේශ හා නීතිරීතීන් නැවතත් මෙම පිටපත් සම්පාදනයේදී ද පිළිපදින ලදී.

5. මෙසේ පිටපත් කිහිපයක් සම්පාදනය කිරීමත් සමගම **කලීෆා උස්මාන්** ؓ තුමා විවිධ පෙදෙස්වල **සහාබි**වරුන් භාරයේ තිබූ **අල් කුර්ආන්** පිටපත් සියල්ල අත්පත් කර පුළුස්සා දැමූහ. මෙහි අරමුණ වූයේ පිළිගත් එකම උච්චාරණයකට අනුව සම්පාදනය වී ඇති එකම **අල් කුර්ආන්** පිටපතක් ලෙස ලොව පුරා පැවතීම යහපත් යැයි එතුමා සිතූ හෙයිනි.

මෙම බැරෑරුම් කටයුත්ත **කලීෆා උස්මාන්** ؓ තුමාණන් සියලු දෙනාගේම අදහස් විමසීමෙන් හා සාකච්ඡා කිරීමෙන් පසුව නිම කළේය. එම නිසාම **අලි** ؓ

XXXIX

අල් කුර්ආන් හැඳින්වීම

තුමාණන් "**උස්මාන්** තුමාණන් පිළිබඳව යහපතක් මිස අන් කිසිවක් නොකියන්න. එතුමා සෑම දෙනාගේම අදහස් විමසමින් **අල් කුර්ආන**ය වෙනුවෙන් ඉතා විශිෂ්ට මෙහෙවරක් ඉටු කළේය" යැයි පැවසුවේය. (**ෆත්හුල් බාරි** 9:15)



4. To accomplish the task cited above, these revered elders basically worked through the pages of the Qur'ān which were written during the times of Sayyidnā Abū Bakr رضى الله عنه . But, along with it, as a matter of added precaution, they adopted exactly the same method that was employed during the times of Sayyidnā Abū Bakr رضى الله عنه . Con-

5. After having these several standard copies of the Qur'ān prepared, Sayyidnā 'Uthmān رضى الله عنه had all copies personally kept by different Companions burnt so that all copies of the Qur'ān become uniform in terms of the script, incorporation of accepted readings and the order of chapters, leaving no room for any difference between them.

The entire *ummah* acknowledged this achievement of Sayyidnā 'Uthmān رضى الله عنه with admiration, and the Companions supported him in this venture. The only exception is that of Sayyidnā 'Abdullāh ibn Mas'ūd رضى الله عنه who was somewhat unhappy about it, something that cannot be taken up here in its proper perspective. Sayyidnā 'Alī رضى الله عنه says:

"Say nothing about 'Uthmān unless it be in his favour because, by God, whatever he did in connection with copies of the Qur'ān was done in the presence of all of us, and with our advice and counsel." (Fath al-Bari, 9/15)

MA'ARIFUL
QUR'AN

තෆ්සීරය හෙවත් අල් කුර්ආන් විවරණය සඳහා වූ මූලාශ්‍රයන්

1. කීර්තිමත් අල් කුර්ආනය

තෆ්සීර් කලාවේ මුල් මූලාශ්‍රය **අල් කුර්ආන**යයි. ඇතැම් විට **අල් කුර්ආන**යේ ඇතැම් **ආයත**යන්* කෙටියෙන් සඳහන් වී ඇති අතර එහි විග්‍රහය තවත් **ආයත**යක් මගින් විවරණය වී ඇත.

උදා : **සූරා අල් ෆාතිහා**වේ '(6) අපව ඍජු මගට රැගෙන යනු මැනව! (7) (එය කෙසේද යත්) ඔබ කවුරුන් කෙරෙහි ආශිර්වාද කළෙහි ද ඔවුන්ගේ මගයි.'

මෙහි 'කවුරුන් කෙරෙහි ආශිර්වාද කළෙහිද' යන පදයේ මෙම පිරිස කවුරුන්දැ'යි සඳහන් වී නොමැත. මෙහි විග්‍රහය **අල් කුර්ආන**යේ තවත් **ආයත**යක සඳහන් වී ඇත. එනම්,

"කවුරුන් **අල්ලාහ්**ට ද **රසූල්**වරයාට* ද අවනත වන්නේ ද ඔවුහු **අල්ලාහ්** ආශිර්වාද කළා වූ **නබි**වරුන්*, **සිද්දීක්**වරුන්*, **ෂහීද්**වරුන්* හා දැහැමියන් සමග වෙති." (**අල් කුර්ආන්** 4:69)

එබැවින් **අල් කුර්ආන්** විග්‍රහකයින් යම් **ආයත**යක් විවරණය කරන්නේ නම් පළමුව **අල් කුර්ආන**යේ එහි විවරණය ඇතිදැ'යි සොයා බලති. එසේ වී නම් ඔවුන් එයට මුල් තැන දෙති.

2. හදීස්

නබි මුහම්මද් ﷺ තුමාණන්ගේ වදන්, ක්‍රියාවන් හා අනුමත කළ දෑ **සුන්නත්** නොහොත් **හදීස්** යනුවෙන් හැඳින් වේ. **අල්ලාහ්** එතුමාණන්ට **අල් කුර්ආනය** පිරිනමා ජනයා වෙත එතුමාණන්ව යැවීමට හේතු වූයේ ඔවුනට එය පැහැදිලි කිරීමට හා එහි නිසි අර්ථය පහදා දීමටය. එතුමාණන් එම වගකීම තමාගේ වචනයෙන් හා ක්‍රියාවෙන් මනා ලෙස ඉටු කළේය. නියතවශයෙන්ම එතුමාගේ සම්පූර්ණ ජීවිතයම **අල් කුර්ආන**යේ ප්‍රායෝගික විවරණයක් විය. මේ හේතුවෙන් **අල් කුර්ආන්** විග්‍රහකයින් **අල් කුර්ආන්** විග්‍රහයේ දෙවන මූලාශ්‍රය ලෙස **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ **හදීස**ය දක්වා ඇත. උදා - පස්වේල නැමදුම එහි අනිවාර්යය බව **අල් කුර්ආන**යේ සඳහන් වුවද එය ඉටු කරන්නා වූ අන්දම **නබි**වදන් මගින් විවරණය කොට ඇත.

XL



The Sources of *Tafsīr*

1. The Glorious Qur'ān

The first source of the knowledge of *tafsīr* is the Holy Qur'ān itself. Accordingly, it happens very often that a certain point which is brief and requires explanation is invariably clarified by some other verse of the Qur'ān itself. For instance, there appears that sentence of prayer in the Sūrah al-Fātihah: اِهْدِنَا الصِّرَاطَ الْمُسْتَقِيْمَ صِرَاطَ الَّذِيْنَ اَنْعَمْتَ عَلَيْهِمْ that is, 'Guide us in the straight path - the path of those on whom You have bestowed Your Grace...' Now it is not clear here as to who are those whom Allah Almighty has blessed. But, in another verse, they have been identified very clearly where it is said:

فَاُولٰٓئِكَ مَعَ الَّذِيْنَ اَنْعَمَ اللّٰهُ عَلَيْهِمْ مِّنَ النَّبِيّٖنَ وَالصِّدِّيْقِيْنَ وَالشُّهَدَآءِ وَالصّٰلِحِيْنَ

So, these are the people whom Allah Almighty has blessed, being the prophets, their true followers, the martyrs (in the way of Allah) and the righteous. (4:69)

Therefore, when respected commentators explain some verse, they first check to see if a *tafsīr* of this verse is already there elsewhere in the noble Qur'ān itself. If it is there, they elect to go by it as their first choice.

2. The *Ḥadīth*

The words and the deeds of the Holy Prophet صلى الله عليه وسلم are called *Ḥadīth*, and as it has been stated earlier, Allah Almighty had sent him with the Qur'ān solely for the purpose that he should explain to people, openly and explicitly, the correct meanings of the noble Qur'ān. Consequently, he discharged this duty with grace and excellence both by his words and deeds. In fact his whole blessed life is, after all, a practical *tafsīr* of Qur'ān. It is for this reason that



3. සහාබිවරුන් විසින් දැන් වූ වාර්තාවන්

සහාබිවරුන් යනු **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ **නබි**ත්වය විශ්වාස කොට එතුමන්ව බැහැදැක ඒ අයුරින්ම මරණයට පත් වූ අනුගාමිකයින් වේ. මොවුන් සියල්ලන් සැදැහැමියන් වූ අතර මොවුන් **අල්ලාහ්**ගේ තෘප්තියට පාත්‍ර වූවන් යැයි **අල් කුර්ආන**යේ සඳහන්ව ඇත. ගෞරවනීය මොවුන් **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගෙන් සෘජුවම දැනුම ලබා ගත්තවුන්ය. එයට අමතරව එතුමාණන් වෙත **වහී*** නම් දේව පණිවිඩ පහළ වන විට ඔවුන් එහි සම්මුඛව සිටියෝය. තවද එම **ආයත**යන් පහළ වීමට හේතු වූ පසුබිම් ද දැන සිටියෝය. එබැවින් **අල් කුර්ආන**ය පැහැදිලි කිරීම විෂයයෙහි ඔවුන්ගේ ප්‍රකාශය ඉතා විශ්වාසනීය හා ස්ථාවරව තිබුණි. ඔවුන්ගෙන් පසුව පැමිණෙන්නන්ට මෙම සුවිශේෂී තත්ත්වය ලැබීමට හැකියාවක් නොතිබුණි. **අල් කුර්ආන**යේ ඇතැම් **ආයත**යන් විග්‍රහ කිරීමේදී ඒ පිළිබඳව **අල් කුර්ආන**යේ වෙනත් **ආයත**යක හෝ **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ **හදීස**යන්හි නොවූයේ නම් **සහාබි**වරුන්ගේ ප්‍රකාශයට මුල් තැනක් දෙනු ලැබේ. **සහාබි**වරුන්ව පිළිකුල් කිරීම හා මනසින් අවතක්සේරු කිරීමද ප්‍රතික්ෂේපකයෙකුගේ සළකුණක් යැයි **අල් කුර්ආන**ය (48:29) අවධාරණය කරයි.

4. තාබිඃවරුන් දැන්වූ වාර්තාවන්

සහාබිවරුන්ගෙන්* පසුව පැමිණි අයට **තාබිඃ**වරුන් යැයි පවසනු ලැබේ. ඔවුන් **අල් කුර්ආන**යේ විවරණය **සහාබි**වරුන්ගෙන් ඉගෙන ගත්තෝය. එබැවින් ඔවුන්ගේ ප්‍රකාශයන්ට ද **තෆ්සීර්** ක්ෂේත්‍රයේ වැදගත් තැනක් දී ඇත. ඇතැම් විශාරදයින් අතර **අල් කුර්ආන්** විවරණයේ මොවුන්ගේ ප්‍රකාශයන් ස්ථිර සාධකයක් ලෙස ගත හැක්කේ දැ’යි මතභේදයක් පවතී. (**අල් ඉත්කාන්** 2:179) නමුත් ඔවුන්ගේ වැදගත්කම ප්‍රතික්ෂේප කළ නොහැක.

5. අරාබි භාෂාව

අල් කුර්ආනය අරාබි භාෂාවෙන් පහළ වූ හෙයින් **අල් කුර්ආන**ය විවරණය කිරීමට මෙම භාෂාවේ සම්පූර්ණ නිපුණත්වයක් තිබීම අනිවාර්යය වන්නේය. **අල් කුර්ආන**යේ ඇතැම් **ආයත**යන්, ඒවා පහළ වීමට හේතු වූ කිසිදු පසුබිමක් නොමැතිවම පැමිණ ඇත. මෙවැනි **ආයත**යන් සඳහා වූ විවරණයන් **අල් කුර්ආන**යේ ද **නබි මුහම්මද්** ﷺ තුමාණන්ගේ **හදීස්**හි* ද **සහාබි**වරුන්ගේ හෝ **තාබිඃ**වරුන්ගේ ප්‍රකාශයේ ද නොවීය. එබැවින් මෙම **ආයත**යන් විවරණ කළ හැක්කේ අරාබි භාෂා සාහිත්‍ය පදනම් කරගෙන පමණි.



3. The Reports from the *Ṣaḥābah*

The noble *Ṣaḥābah* (Companions), may Allah be pleased with them all, had received their education directly from the Holy Prophet ﷺ. In addition to that, they were personally present on the scene when *Wahy* came, and they had themselves witnessed all circumstances and backgrounds of the revelation of the Qur'ān. Therefore, naturally, the recorded statements of these blessed souls are far more authentic and trustworthy in explaining the noble Qur'ān; the later people cannot take that place. Hence, in the case of verses the explanation of which is not found in the Qur'ān or *Ḥadīth*, statements recorded from the noble Companions are given the highest priority. Consequently, if there is a consensus of Companions on the explanation of a certain verse, the commentators follow just that, and explaining it in any way, other than that, is not permissible. By the way, if the statements of Companions differ in the interpretation (*tafsīr*) of a certain verse, then the commentators who come later examine them in the light of arguments and determine as to which interpretation or explanation can be given preference. In order to handle this situation, there is an important corpus of rules and regulations already codified under the sciences of *Uṣūl al-Fiqh*, *Uṣūl al-Ḥadīth* and *Uṣūl al-Tafsīr* a detailed discussion of which is not appropriate here.

4. The Reports from the *Tābi'īn* or Successors

After Companions (*Ṣaḥābah*) come the Successors (*Tābi'īn*). The later are those who have learnt the *tafsīr* of Qur'ān from the Companions. Therefore, their statements too have great importance in the science of *tafsīr*, although there exists a difference among scholars whether or not the statements of the *tābi'īn* are decisive evidences in *tafsīr* (al-Itqan, 2/179) but their importance is something which cannot be denied.

5. The Arabic Language

Since the noble Qur'ān was revealed in the Arabic language, therefore, in order to explain the Qur'ān, it is necessary to have a complete mastery over the language. There are several verses of the noble Qur'ān in the background of which there happen to be just no attending circumstances of revelations, or any juristic or scholastic question, therefore, in their *tafsīr* or explanation, the sayings of the Holy Prophet صلى الله عليه وسلم or the statements of the *ṣaḥābah* and *tābi'īn* are not reported. For that reason, the only means through which these can be explained is that of the Arabic language, and it is on th basis of language alone that they are elucidated. Besides that, should there be some difference in the *tafsīr* of a certain verse, then, in that case too, the science of linguistics is used to run a test of veracity between varying opinions.



6. අල් කුර්ආන් පරිශීලනය හා නිගමනය

තෆ්සීර් හෙවත් **අල් කුර්ආන්** විවරණයේ අවසාන මූලාශ්‍රය වන්නේ පරිශීලනය හා නිගමනයයි. **අල් කුර්ආන**යේ ඇති සැඟවුණු අර්ථයන් අන්තයක් නොමැති මහා සාගරයක් මෙනි. එබැවින් ඉස්ලාමය පිළිබඳව ගැඹුරු දැනුම ලැබූවෙකු කෙතරම් දුරට ඒවා පරිශීලනය කරන්නේද ඔහුට එම සැඟවුණු අර්ථයන් පිළිබිඹු වේ. එම සැඟවුණු අර්ථයන් පිළිගනු ලබන්නේ ඉහත සඳහන් මූලාශ්‍රයන් පහට පටහැණි නොවූයේ නම් පමණි. එබැවින් කෙනෙකු **අල් කුර්ආනය** විග්‍රහ කිරීමේදී **අල් කුර්ආන**යට හා **හදීස**යට, **ඉජ්මා** නම් ඒකමතිකභාවයට, භාෂාවට, **සහාබි**වරුන්ගේ හා **තාබිඃ**වරුන්ගේ ප්‍රකාශයන්ට හෝ ඉස්ලාමීය නීති සංග්‍රහයේ මූලධර්මයන් වලට පටහැණි වන්නේ නම් එය පිළිගනු නොලබන්නේය. (**අල් ඉත්කාන්** 2:184)



6. Deliberation and Deduction

The last source of *tafsīr* consists of deliberation and deduction. The subtleties and mysteries of the noble Qur'ān are an ocean with no shore, no end. Therefore, the more a person, who has been blessed with insight into the Islamic sciences by Allah Almighty, deliberates in it, the more he discovers ever-new mysteries and subtleties. As a result of this, commentators do present the outcomes of their respective deliberations as well, but mysteries and subtleties so described are found acceptable only when they do not go against the five sources mentioned above. So, should a person, while explaining the Qur'ān, come out with a subtle point or independent judgment which is contrary to the Qur'ān and Sunnah, Consensus (*Ijmā'*), Language, or the statements of Companions and Successors, or stands in conflict with another principle of Sharī'ah, that will then have no credence. Some mystics (رحمهم الله) had started describing such mysteries and subtleties in *tafsīr*, but investigative scholars of the *ummah* did not consider these trustworthy because the personal opinion of any

Introduction 41

person against the basic principles of the Qur'ān, Sunnah and Sharī'ah has obviously no weight. (al-Itqan, 2/184)



අල් කුර්ආනය පහසුවෙන් පාරායනය කිරීම සඳහා ගන්නා ලද ඇතැම් පියවර

කලීෆා උස්මාන් ﵁ තුමා ඉටු කළ මෙම මිල කළ නොහැකි මහඟු සේවයෙන් පසු එයට පටහැණි වැයමක් නොගන්නා බවට එකල විසූ හා ඉන් පසු කාලවල පැමිණි ධර්ම විශාරදයින් තීන්දු කර ගත්හ. **උස්මාන්** ﵁ තුමාගේ මෙම සම්පාදනය පිටපත් කිහිපයකට නගා ලොව නන් දෙසට යවන ලදී. කෙසේ වුවද මෙම සම්පාදනයෙහි කියවීම පහසු කරවන **ෆත්හා, කස්රා, ලම්මා, නුක්තා** යන යෙදුම් නොමැති නිසා අරාබි නොවන අය මඳ අපහසුතාවකට පත් වූහ. පසු කලෙකදී එම යෙදුම් සහිත පිටපත් බොහෝමයක් බිහි විය. මෙය අරාබි භාෂාවේ සම්ප්‍රදායන් අනුගමනය කරමින් කියවීම පහසු කරවීම පිණිස වූ පියවරක් පමණක් වූ අතර අර්ථයේ කිසිදු ආකාරයක වෙනස්කමක් මෙමගින් සිදුවී නොමැත.

උස්මාන් ﵁ තුමාගේ ඉහත සාධනයෙන් පසු **උස්මානි** අක්ෂර භාවිත නොකර අන් ලෙසකින් **අල් කුර්ආනය** ලිවීමට අනුමැතිය ලබා නොදිය යුතුයි යන එකඟතාවට මුස්ලිම් ලෝකයා එළැඹුණහ. එයින් පසු වකවානුවල පැමිණි මුස්ලිම් වියතුන් සියල්ලන්ම **අල් කුර්ආනය** ලිවීමට මෙම ක්‍රමය අනුගමනය කළහ. ඒ අනුව ලොවෙහි විවිධ ප්‍රදේශවලට **අල් කුර්ආන**යේ පිටපත් යවන්නට ද කටයුතු කරන ලදී. එසේ වුවද මේ වන විට ලොව විවිධ අරාබි නොවන රටවලට පවා ඉස්ලාමය පැතිරෙන්නට වූ තත්ත්වයක එක් සංකීර්ණ ගැටළුවක් ඇති විය. එනම් **උස්මානි** අක්ෂර ක්‍රමයට නැවතීමේ ලකුණු සහ ප්‍රාණාක්ෂර වැනි දේ ඇතුළත් නොවූ නිසා අරාබි බස ඉගෙන නොගෙන අකුරු පමණක් ඉගෙන ගන්නට වූ විවිධ රටවල අරාබි නොවන මුස්ලිම්වරුන්ට **අල් කුර්ආන**ය කියවීම ඉතා අසීරු විය. මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීමට පියවර කිහිපයක් ගන්නා ලදී.

තිත් යෙදීම

තිත් නොමැතිව **අල් කුර්ආනය** කියවීම අරාබින්ට අසීරු නොවූ අතර සැක සහිත - එනම් අරුත් වැඩි ගණනක් ඇති- වචන වටහා ගැනීමට ඔවුන් අදාළ සිද්ධියේ පසුතලය පදනම් කරගනිමින් එයින් විග්‍රහ ලබා ගත්හ. එසේ වුවද **අල් කුර්ආනය** ප්‍රාරම්භයෙහි සංරක්ෂණය කරන ලද්දේ ලියා තැබීමට වඩා සිත්හි ධාරණය කර ගැනීම මගින් වන අතර **අල් කුර්ආන්** පිටපත් විවිධ ප්‍රදේශවලට යවන විට **උස්මාන්** ﵁ තුමා **අල් කුර්ආනය** කටපාඩමින් පාරායනය කර සිටි **හාෆිල්**වරුන්ව ද එසමගම යැවූහ. ඔවුන් **අල් කුර්ආනය** පාරායනය කරන හැටි අන් අයට ප්‍රායෝගිකව ඉගැන්වූහ.

අල් කුර්ආනයට තිත් සලකුණු පළමුවරට එක් කරන ලද්දේ **අබූ අල් අස්වද් අල් දුආලි** ﵁ තුමාණන් විසින් යැයි ද **කූෆා** ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා **සියාද් බින් අබූ සුෆ්යාන්**ගේ නිර්දේශය පරිදි එය **අලි** ﵁ තුමාණන් විසින් කරන ලද්දේ යැයි ද විවිධ අන්දමින් වාර්තා වී ඇත. තවත් සටහනක් අනුව සඳහන් වී ඇත්තේ මෙයට මූලික වුයේ **හසන් අල් බසරී, යහ්යා බින් යාමුර්** සහ **නසර් ඉබ්න් ආසිම් අල් ලයිති** ආදින්ගේ සහය සහිතව **හජ්ජාජ් බින් යූසුෆ්** මෙම කාර්යය සිදු කර ඇත යන්නය.

තෆ්සීරුල් කුර්තුබීහි මෙසේ සඳහන් වෙයි. 'තිත් යෙදීම මෙන්ම පිල්ලම් යෙදුමද ආරම්භයෙහි **අල් කුර්ආන**යට නොතිබුනු අතර පසුව මෙය යොදන ලදී. මෙයට දායක වුවන් පිලිබඳව විවිධ මත පවතියි. එය කරන ලද්දේ **අබූ අල් අස්වද් අල් දුආලි** ﵁ විසින් යැයිද **යහ්යා බින් යාමුර්** සහ **නසර් ඉබ්නු ආසිම් අල් ලයිති** ආදින්ගේ සහය සහිතව **හජ්ජාජ් බින් යූසුෆ්** විසින් මෙම කාරිය සිදු කරන ලද්දේය.' (**තෆ්සීරුල් කුර්තුබී** 1:63)





Steps Taken to Facilitate Recitation

After the afore-mentioned achievement of Sayyidnā 'Uthmān رضی اللہ عنہ, the *ummah* reached a consensus on the rule that it is not permissible to write the text of the noble Qur'an using any method other than the 'Uthmāni Script. Consequently, all copies of the Qur'an were, later on, written in accordance with this method, and the Companions and their successors, may Allah be pleased with them all, by bringing forth repeatedly, reproductions of the standard 'Uthmāni copies of the Qur'ān, helped spread the noble Qur'ān on a vast scale.

But, the copies of the noble Qur'ān were still devoid of dots and vowel points or desinential marks which made it difficult for non-Arabs to recite them freely. As Islam spread out wide and deep in non-Arab countries, the need to add dots and vowel points became acute, in order that people may be able to recite them easily. Several steps were taken to achieve this purpose. Their brief history is as follows:

Inclusion of Dots

The practice of placing dots over or under letters was just not there among early Arabs, however, the readers were so used to this style that they had practically no difficulty in reading dot-less writing to the limit that they would easily distinguish between doubtful letters by referring to the context. Specially, there was no possibility of any doubt in the case of the noble Qur'ān because its preservation did not rest on writing, rather on the strength of memories, pursuant to which, Sayyidnā 'Uthmān رضی اللہ عنہ had assigned *Qāris*, accomplished reciters of the Qur'ān, along with its copies sent out to various parts of the Muslim world so that they could teach how to read it.

There are different reports as to who first placed dots on the copy of the noble Qur'ān. Some reports say that this feat was first accomplished by Ḥadrat Abū al-Aswad al-Du'ali رحمۃ اللہ علیہ (al-Burhan, 1/250). Some say he did this under the instructions of Sayyidnā 'Alī کرم اللہ وجہہ (Subh al-A'sha, 3/155). There are others who have said that Ziyād ibn Abī Sufyan, the Governor of Kufah, asked him to do this. Then there is yet another report which credits Hajjaj ibn Yūsuf with this feat who did it with the help of Ḥasan al-Basrī, Yaḥya ibn Ya'mur and Naṣr ibn 'Āṣim al-Laythī, may Allah's mercy be upon them all. (Tafsir al-Qurtubi, 1/63)

හාෆිල්වරුන්ව ද එසමගම යැවූහ. ඔවුන් **අල් කුර්ආනය** පාරායනය කරන හැටි අන් අයට ප්‍රායෝගිකව ඉගැන්වූහ.

අල් කුර්ආනයට තිත් සලකුණු පළමුවරට එක් කරන ලද්දේ **අබූ අල් අස්වද් අල් දුආලි** ؓ තුමාණන් විසින් යැයි ද **කූෆා** ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා **සියාද් බින් අබූ සුෆ්යාන්**ගේ නිර්දේශය පරිදි එය **අලි** ؓ තුමාණන් විසින් කරන ලද්දේ යැයි ද විවිධ අන්දමින් වාර්තා වී ඇත. තවත් සටහනක් අනුව සඳහන් වී ඇත්තේ මෙයට මූලික වුයේ **හසන් අල් බසරී, යහ්යා බින් යාමුර්** සහ **නසර් ඉබ්න් ආසිම් අල් ලයිති** ආදීන්ගේ සහය සහිතව **හජ්ජාජ් බින් යූසුෆ්** මෙම කාර්යය සිදු කර ඇත යන්නය.

තෆ්සීරුල් කුර්තුබීහි මෙසේ සඳහන් වෙයි. 'තිත් යෙදීම මෙන්ම පිල්ලම් යෙදුමද ආරම්භයෙහි **අල් කුර්ආන**යට නොතිබුනු අතර පසුව මෙය යොදන ලදී. මෙයට දායක වුවන් පිලිබඳව විවිධ මත පවතියි. එය කරන ලද්දේ **අබූ අල් අස්වද් අල් දුආලි** ؓ විසින් යැයිද **යහ්යා බින් යාමුර්** සහ **නසර් ඉබ්නු ආසිම් අල් ලයිති** ආදීන්ගේ සහය සහිතව **හජ්ජාජ් බින් යූසුෆ්** විසින් මෙම කාරිය සිදු කරන ලද්දේය.' (**තෆ්සීරුල් කුර්තුබී** 1:63)

පිල්ලම් යෙදුම පළමුවෙන් සොයා ගන්නා ලද්දේ **අබූ අල් අස්වද් අල් දුආලි** ؓ තුමාණන් විසින් යැයි පෙනෙන අතර වර්තමානයෙහි එම සලකුණු වෙනස් වී ඇත. **ෆත්හා** යන පිල්ලම වෙනුවට අක්ෂරය උඩින් තිතක් (˙_) ද, **කස්රා** යන පිල්ලම වෙනුවට අකෂරය පහලින් තිතක් (_̣) ද, **ළම්මා** යන පිල්ලම වෙනුවට අක්ෂරය ඉදිරියේ තිතක් (.__)ද, **තන්වීන්** සඳහා තිත් දෙකක් උඩින් (¨_) හෝ යටින් (_̤) ද යොදන ලදී. **හම්zසා** හා **තශ්දීද්** සඳහා වන සලකුණු පසු කලෙක සොයා ගන්නා ලද්දේ **කලීල් ඉබ්නු අහ්මද්** තුමාණන් විසිනි. ඉන් අනතුරුව **අල් කුර්ආන**යට තිත් යොදන මෙන් හා පිල්ලම් යොදන මෙන් **යහ්යා බින් යාමුර්** සහ **නසර් ඉබ්නු ආසිම් අල් ලයිති** තුමාණන්ට **හජ්ජාජ් බින් යූසුෆ්** උපදෙස් කර ඇත. මෙවිට වර්තමානයේ **අල් කුර්ආන**යෙහි භාවිත වන පිල්ලම් යෙදීමේ ක්‍රමවේදය හා තිත් යෙදීමේ ක්‍රමවේදය සම්මත කරන ලදී.

අහ්zසාබ් නොහොත් මනාzසිල්

අල් කුර්ආනය සෑම සතියකට වරක්ම පාරායනය කර අවසන් කිරීම **සහාබි**වරුන් හා **තාබිඊන්**වරුන්ගේ සිරිතක් විය. මේ සඳහා දිනපතා පාරායනය කළ යුතු ආකාරයෙන් ඔවුන් **අල් කුර්ආනය** කොටස් 7 කට වෙන් කර ගත්හ. මෙයට **අහ්zසාබ්** (**හිzස්බ්** යන පදයේ බහු වචනය) හෙවත් **මනාzසිල්** (**මන්zසිල්** යන පදයේ බහුවචනය) යැයි කියනු ලැබේ. (**අල් බුර්හාන්** 1:250)

අජ්zසා හෙවත් කොටස්

වර්තමානයෙහි **අල් කුර්ආනය** සමාන කාණ්ඩ 30 කට බෙදා ඇති අතර මෙය **ජුzසු** යන පදයේ බහු වචනය වන **අජ්zසා** හෙවත් කොටස් යැයි කියනු ලැබේ. මෙය පරිච්ඡේද අනුව හෝ තේරුම අනුව කරන ලද කාණ්ඩ කිරීමක් නොවේ. මෙසේ බෙදන විට වාක්‍ය මැදින් පවා වෙන් වී ඇති බව නිරීක්ෂණය



Marks for correct reading

In the beginning, like dots, the Qur'ān did not have any desinential marks either. Here too, reports are at variance as to who placed desinential marks first. Some say Abū al-Aswad al-Du'alī did it first while others claim that this was accomplished by Ḥajjāj ibn Yūsuf through Yaḥyā ibn Ya'mur and Naṣr ibn 'Āṣim al-Laythī. (Ibid)

Keeping in view all reports in this connection, it appears that desinential marks were first invented by Abū al-Aswad al-Du'alī, but they were not like what they are today. Instead, placed there for *fathah* was a dot (˙_) over the letter, for *kasrah* a dot (_̣) under the letter, for *ḍammah* a dot (__.) in front of the letter; and there were two dots (¨_ or _̤ or __..) for *tanwīn* or nunnation. It was only later that Khalīl ibn Ahmad innovated the signs of *hamzah* (glottal stop) and *tashdīd* (doubling). (Subh al-A'sha, 3/160-161) After that, Hajjāj ibn Yusuf requested Yaḥyā ibn Ya'mur, Naṣr ibn 'Āṣim al-Laythī and Ḥasan al-Baṣrī, may Allah's mercy be upon them all, to simultaneously place dots and desinential marks on the text of the noble Qur'ān. On this occasion, the present forms of desinential marks were chosen to replace dots as expression of case signs. The purpose was to avoid confusing them with dots intrinsically belonging to letters.

Aḥzāb or *Manazil*

It was the practice of Companions and their Successors that they would complete the recital of the entire Qur'ān once every week. For this purpose, they had identified fixed portions for their daily recitation which is known as '*ḥizb*' or '*manzil*'. Thus the entire Qur'ān was divided over seven '*aḥzāb*' (plural of '*ḥizb*') '*manāzil*' (plural of '*manzil*'). (al-Burhan, 1/250)



අජ්zසා හෙවත් කොටස්

වර්තමානයෙහි **අල් කුර්ආනය** සමාන කාණ්ඩ 30 කට බෙදා ඇති අතර මෙය **ජුzසු** යන පදයේ බහු වචනය වන **අජ්zසා** හෙවත් කොටස් යැයි කියනු ලැබේ. මෙය පරිච්ඡේද අනුව හෝ තේරුම අනුව කරන ලද කාණ්ඩ කිරීමක් නොවේ. මෙසේ බෙදන විට වාක්‍ය මැදින් පවා වෙන් වී ඇති බව නිරීක්ෂණය කළ හැක. මෙසේ වෙන් කරන ලද්දේ ළමුන්ට **අල් කුර්ආනය** ඉගැන්වීමේ පහසුව තකාය. මෙසේ වෙන් කරන ලද්දේ කවුරුන් විසින්ද යන කරුණ පැහැදිලි නැත. ඇතැම් විට **අල් කුර්ආනයේ** පිටපත් සම්පාදනය කරන විට **උස්මාන්** ؓ තුමාණන් මෙසේ කරන්නට ඇතැයි යන මතයක් පවතියි. ඉපැරණි පාඨශාලාවල භාවිත කළ සියලුම **අල් කුර්ආන්** පිටපත් මෙලෙසින් කාණ්ඩ 30 කට වෙන් කර තිබූ බව **අල්ලාමා බද්ර් අද්දීන් අල් zසර්කශී** තුමාණන් පවසයි. (**අල් බුර්හාන්** 1:250, **මනාහිලුල් ඉර්ෆාන්** 1:402)

අඃක්මාස් සහ අඃෂාර් (පහේ සහ දහයේ කාණ්ඩ)

පසුගිය ශත වර්ෂ වල **අල් කුර්ආන්** පිටපත්වල දක්නට ලැබුනු දෙයක් නම් **ආයතයන්** පහකින් පසු اخماس : පහ, හෝ එහි කෙටි යෙදුම වන (خ) යැයි ද **ආයතයන්** දහයකින් පසු عشر : දහය, හෝ එහි කෙටි යෙදුම වන (ع) යැයි ද එහි අග සඳහන් කිරීමය. මෙයට **අඃක්මාස්** اخماس හෙවත් පහේ කාණ්ඩය හා **අඃෂාර්** اعشار හෙවත් දහයේ කාණ්ඩය යනුවෙන් හඳුන්වනු ලැබූහ. මෙසේ ලකුණු යෙදීමට ඇතැම් විද්වතුන් අනුමැතිය පළ කළද තවත් ඇතැමුන් මෙය **මක්රූහ්** පිළිකුල් සහගත ක්‍රියාවක් යැයි පළ කළහ. මෙසේ කරන ලද්දේ කවුරුන් විසින් ද’යි නිශ්චය වශයෙන්ම පැවසීමට නොහැකි නමුත් ඇතැමුන් **හජ්ජාජ් බින් යූසුෆ්** යැයි ද **අබ්බාසි කලීෆා**වරයෙකු වූ **අල් මාමූන්** විසින් යැයි ද වෙනස් මත දරති. එසේ වුවද **අඃෂාර්** යන මතය **සහාබි**වරුන්ගේ කාලයේ සිටම පවතින හෙයින් ඉහත මත එතරම් වලංගු වන්නේ නැත. උදාහරණයකට **අල් කුර්ආනයේ අඃෂාර්** සලකුණු කිරීම **මක්රූහ්** යැයි **අබ්දුල්ලා ඉබ්නු මස්ඌද්** ؓ තුමාණන් පැවසූ බව ප්‍රකට **තාබියීන්**වරයෙකු වන **මස්රූක්** තුමාණන් දන්වා ඇත. (**මුසන්නිෆ් ඉබ්නු අබී ෂයිබා** 2:497)





Ajzā' or Parts

Today, the Qur'ān is divided over thirty '*ajz'ā*' (plural of '*juz*') or parts. This division in parts has nothing to do with the meaning of the Qur'ān. In fact, this division in thirty equal parts has been made to serve as teaching aid for children as, it will be noticed, there are places where the designated part ends with an unfinished statement. It is difficult to say with certainty as to who brought about this division of the Qur'ān in thirty parts. Some people believe that Sayyidnā 'Uthmān رضى الله عنه had arranged to have these written in thirty different folio-units while their copies were being made, therefore, this division dates back to his time for sure. But, this humble writer was unable to find any proof of this position in the writings of earlier scholars. However, 'Allāmah Badr al-Dīn al-Zarkashī has written that the thirty parts of the Qur'ān have been known all along and they customarily appear in copies of the Qur'ān used in schools. (al-Burhan, 1/250; Manahil al-'Irfan, 1/402)

Akhmās and *A'shār*: The sets of Fives and Tens

Another sign used in Qur'ānic copies of early centuries was that they would write the word, *khams* (خمس : five) or its abbreviation (خ) after every five verses (on the margin); and the word, '*Ashr* (عشر : ten) or its abbreviation (ع) after every ten verses. The former kind of signs were called '*Akhmās*' (a pentad or group of five) and the later, '*A'shār*' (a decade or group of ten). Consequent to another difference among early scholars, these signs were considered permissible by some, and reprehensible or *makrūh* by others. Saying, with any degree of certainty, as to who was the first to place the signs, is difficult indeed. According to one view, Ḥajjāj ibn Yūsuf was its inventor, while another view credits this to an order of 'Abbasi Khalīfah, al-Ma'mūn (al-Burhan, 1/251). But, these two views do not appear to be sound since the idea of *a'shār* seems to be there during the times of the Companions. For example, *Masrūq*' a well-known *Tabi'ī*, says that with Sayyidnā 'Abdullāh ibn Mas'ūd رضى الله عنه, the placement of '*A'shār*' markings in the copy of the Qur'ān was *makrūh*. (Musannaf ibn Abi Shaybah, 2/497).

රුකූඃ යනුවෙන් හැඳින්වෙන කොටස්

පසු කාලයෙහි **අඃක්මාස්** හා **අඃෂාර්** සලකුණු කිරීම අත් හරින ලද අතර පසුව පැමිණි **රුකූඃ** සලකුණ ක්‍රමය අද වන තුරු යොදනු දැකිය හැකිය. මෙය යම් සිද්ධියක් හෝ ප්‍රකාශයක් අවසන් වන විට (ع) නැමැති අක්ෂරය යොදා තිබීමයි. **සලාතයේ රකඅත්** එකකදී පාරායනය කළයුතු කොටසක් වෙන් කර දීම මෙහි අරමුණ වන බව පැහැදිලිය. මෙයට **රුකූඃ** යැයි පවසනු ලබන්නේ එය අවසන් වූ විට **සලාත**යේදී තුනටිය නමා දනහිස් අල්ලා සිටින ඉරියව්ව වන **රුකූඃ** නම් ඉරියව්වට අවතීර්ණ වන හෙයිනි. **අල් කුර්ආනයේ** එවන් **රුකූඃ** 540 ක් ඇත. (**ෆතාවා අල් මුඃගීරා, ෆස්ලුත් තරාවීහ්** 1:94)

රුමූzස් අල් අව්කාෆ් හෙවත් නැවතීමේ සලකුණු

තිලාවා හෙවත් ස්වර ශික්ෂාව අනුව පාරායනය හා **තජ්වීද්** හෙවත් නිවැරදි උච්චාරණයෙන් පාරායනය යන නිවැරදි පාරායන ක්‍රමයන් අනුගමනය කිරීම පහසු කරනු පිණිස **රුමූzස් අලාමාත්** හා **අව්කාෆ්** නැමැති නිසි නැවතීමේ හා හුස්ම ගැනීමේ තැන් පෙන්වන ක්‍රමයක් පසුව හඳුන්වා දෙන ලදී. අරාබි බස කියවන්නට පමණක් දන්නා, එහෙත් අරුත නොවැටහෙන මුස්ලිම්වරුන් **අල්**

කුර්ආනය පාරායනය කරන විට අරුත වෙනස් නොවනු පිණිස පාරායනය නැවැත්විය යුතු තැන් හා නොනැවැත්විය යුතු තැන් පෙන්වා දීම මෙහි අරමුණයි. මෙම සලකුණු හඳුන්වා දෙන ලද්දේ **අල්ලාමා අබූ අබ්දුල්ලාහ් මුහම්මද් ඉබ්නු තයිෆුර් සජාවන්දි** තුමා විසිනි. (**අන් නෂ්ර් ෆී කිරාඅතිල් අෂ්ර්** 1:225) මෙම සලකුණුවල විස්තරය පහත දක්වා ඇත.

(ط) - මෙම අක්ෂරය **අල් වක්ෆ් අල් මුත්ලක්** යන්නෙහි කෙටි යෙදුමයි. මෙයින් පෙන්වන්නේ එක් ප්‍රකාශයක් මෙහි අවසන් වන බව හා මෙහි පාරායනය මඳක් නැවැත්වීම සුදුසු බවයි.

(ج) - මෙම අක්ෂරය **අල් වක්ෆ් අල් ජායිzස්** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි දී පාරායනය නැවැත්වීමට අවසරය ඇත.

(ز) - මෙම අක්ෂරය **අල් වක්ෆ් අල් මුජව්වzසා** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි දී පාරායනය නැවැත්වීම එතරම් සුදුසු නැත.



Rukū‘ or Section

Moreover, the signs of *Akhmās* and *A‘shār* were abandoned later on but, yet another sign which continues on even to this day is the sign of *rukū‘* or section. This has been determined in terms of the contents of the noble Qur’ān whereby a sign of *rukū‘* (the letter ع on the margin) is placed at the conclusion of a statement. Inspite of his efforts, this humble writer was unable to locate anything authentic which would tell us as to who originated the *rukū‘*, and in what period. However, this much is almost certain that the purpose of this sign is to identify an average portion of verses which could be recited in one *raka‘ah*. It is called '*rukū‘*' so that *rukū‘* (bending position) could be made in *ṣalāh*

after reaching this point. There are 540 *rukū‘āt* in the whole Qur’ān. So, by reciting one *rukū‘* in every *raka‘ah* of *tarāwih*, it is possible to complete the recital of the entire Qur’ān on the night of the twenty seventh (Fatawa ‘Alamgiryah, Fasl al-Tarawih, 1/94).

Rumūz al-Awqāf: Stop Signs

Another useful step taken to facilitate recitation and phonetically correct pronunciation (*tilāwah* and *tajwīd*) was to provide signs with Qur’ānic sentences which could tell the nature of making a stop (breathing) there. These signs are known as the '*rumūz*' (signs) or ‘*alāmāt* (symbols) of *awqāf* (stops). Their purpose is to help a person who does not know Arabic to stop at the correct spot during his recitation, and thus, avoid causing a change in meaning by breaking his breath at the wrong spot. Most of these signs were first invented by ‘Allamāh Abū ‘Abdullāh Muḥammad ibn Tayfūr Sajāwandī, may Allah's mercy be upon him (Al-Nashr fi al-Qira’at al-‘Ashr, 1/225). Details about these signs are given below:

ط : This letter ***Tā’*** is an abbreviated form of *al-waqf al-mutlaq*. It means that the statement stands completed at this point. Therefore, it is better to stop here.

ج : This letter ***Jīm*** is an abbreviation of *al-waqf al-jā’iz* and it means that it is permissible to stop here.

ز : This letter ***Zā’*** is an abbreviation of *al-waqf al-mujawwaz*. It means that making a stop here is correct all right, but the better choice is not to make a stop here.



(ص) - මෙම අක්‍ෂරය **අල් වක්ෆ් අල් මුරක්කාස්** යන්නෙහි කෙටි යෙදුමයි. ඉතා දිග **ආයත**යක අතර මැද මඳක් නවතා හුස්ම ගැනීමට අවශ්‍ය නම් එයට සුදුසු ස්ථානය මෙයයි.

(م) - මෙම අක්ෂරය **අල් වක්ෆ් අල් ලාzසිම්** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි අනිවාර්යයෙන්ම නැවත්විය යුතුය. මෙහි නොනවතා පාරායනය කළහොත් ඉතා විපරීත හා ප්‍රතිවිරුද්ධ අරුතක් ගෙන දෙනු ඇත. (**අන් නෂ්ර්** 1:231)

(لا) - මෙම අක්ෂරය **අල් ලාකිෆ්** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි පාරායනය නැවැත්වීම නුසුදුසුය. එසේ වුවද මෙහි නොනවත්වා පාරායනය කිරීම නිසා ප්‍රතිවිරුද්ධ අරුතක් ඇති වන්නේ නැති හෙයින් නැවැත්වීමටද අවසර ඇත. එසේ වුවද හුස්ම ගැනීම සඳහා මෙහි නැවැත්වීමට සිදු වුවහොත් එම **ආයත**යේ මඳක් ආපස්සට ගොස් නැවත පාරායනය ආරම්භ කර මෙම ස්ථානයෙහි නොනවත්වා **ආයත**ය අවසන් කිරීම වඩාත් ප්‍රසන්නය. මෙම ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ **අල්ලාමා සජාවන්දි** තුමාණන් විසින් වන අතර ඔහු හඳුන්වා දුන් තවත් සලකුණු කිහිපයක් පහත විස්තර කර ඇත. (**අන් නෂ්ර්** 1:233)

(مع) - මෙම සළකුණ **මුආනකා** යන්නෙහි කෙටි යෙදුමයි. මෙය අදහස් දෙකක් ඇති **ආයත**යන්වලට යොදනු ලැබේ. මෙම සලකුණු ඇති **ආයත**යන් පාරායනය කරන අතරතුර මඳක් නැවැත්විය හැකි ස්ථාන දෙකක් ඇති අතර නැවැත්විය හැක්කේ එක ස්ථානයක පමණි. මෙම ස්ථාන දෙකෙහිම නොනවතා පාරායනය කිරීම තවත් විකල්පයකි. මෙවන් වැකිවලට **අල් මුකබ්බලාත්** යැයිද කියනු ලැබේ. මෙම පැහැදිලි කිරීම පළමුවරට ඉදිරිපත් කරන ලද්දේ **ඉමාම් අබු අල් ෆද්ල්** තුමා විසිනි. (**අන් නෂ්ර්** 1:237, **අල් ඉත්කාන්** 1:88)

(سكته) - මෙහි අරුත නිශ්ශබ්ද වීම වේ. මෙහි ශබ්දය නැවැත්විය යුතු නමුත් හුස්ම නොගත යුතුය.





ص : This letter *Ṣād* is an abbreviation of *al-waqf al-murakhkhaṣ*. It means that the statement has not yet been completed at this point but, because the sentence has become long, here is the place to breathe and stop rather than do it elsewhere (al-Mianh al-Fikriyyah, p. 63).

م : This letter ***mīm*** is an abbreviation of *al-waqf al-lāzim*. It means if a stop is not made here an outrageous distortion in the meaning of the verse is possible. So, it is better to stop here. Some phoneticians of the Qur'ān have also called this *al-waqf al-wājib* or the obligatory stop. But this is not '*wājib*' of *fiqh* which brings sin if abandoned. In fact, the purpose is to stress that making a stop here is the most preferable of all stops (al-Nashr, 1/231).

لا : This letter ***lā*** is an abbreviation of *lā taqif*. It means 'do not stop here,' but it does not imply that making a stop here is impermissible, because there are certain places bearing this sign where making a stop brings no harm and making an initiation from the following word is also permissible. Therefore, the correct meaning of this sign is: If a stop is made here, it is better to go back and read over again. Initiation from the next word is not approved (al-Nashr, 1/233).

As far as the origin of these signs is concerned, it stands proved beyond doubt that they were invented by 'Allamāh Sajāwandī. In addition to these, there are some other signs as well that appear in the copies of the Qur'ān, for instance:

مع : This ***ma'*** is an abbreviation of "*mu'ānaqah*". This symbol is inserted at a place where a single verse has two possible explanations. According to one explanation, the stop will be made at one given place, while according to another explanation, this will be at another place. So, a stop can be made at either one of the two places, but once a stop has been made at one place, it is not correct to stop at the other. For instance, take the verse ذٰلِكَ مَثَلُهُمْ فِى التَّوْرٰىةِ وَمَثَلُهُمْ فِى الْاِنْجِيْلِ كَزَرْعٍ اَخْرَجَ شَطْاَهٗ . If a stop is made here at التوراة , then it is not correct to stop at الانجيل and should a stop be made at الانجيل , then it is not correct to stop at التوراة . However, if a stop is not made at both places, that will be correct. It is also known as '*al-muqābalah*'. It was, first of all, pointed out by Imām Abū al-Faḍl al-Rāzī (al-Nashr, 1/237 and al-Itqan, 1/88).

سكته : This is a symbol for ***saktah***. It means one should stop here breaking the sound but not the breath. This is generally inserted at a place where assimilated reading is likely to cause an erroneous projection of meaning.

(وقفه) - මෙම ස්ථානවල **සක්තා** ස්ථානවලට වඩා වැඩි වේලාවක් නවතා සිටිය යුතුය. නමුත් අලුත් හුස්මක් නොගත යුතුය.

(ق) - මෙය **කිලා අලෛහිල් වක්ෆ්** යන්නෙහි කෙටි යෙදුමයි. පාරායන අවස්ථාවේදී මෙහි නැවැත්විය යුතු යැයි ද නොනැවැත්විය යුතු යැයි ද විශාරද මත දෙකක් ඇති හෙයින් පාරායනය කරන්නාගේ අභිමතය පරිදි ක්‍රියා කළ හැක.

(قف) - මෙහි අරුත 'නවත්වන්න' යනුවෙනි. මෙහිදී නැවැත්වීමට අනුමත ඇත. නැවැත්වීමක් අවශ්‍ය නැත යැයි පොදුවේ කවුරුත් සිතන ස්ථානවල මෙම සලකුණ යොදා ඇත.

(صلى) - මෙය **අල් වස්ලු අව්ලා** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි නොනවතා පාරායනය කිරීම වඩා උචිතය.

(صل) - මෙය **කද් යුසාලු අල් වස්ලු අව්ලා** යන්නෙහි කෙටි යෙදුමයි. මෙහි ඇතැමුන් නවතා පාරායනය කිරීමද තවත් ඇතැමුන් නොනවතා පාරායනය කිරීමද සුදුසු යැයි අදහස් දක්වති.

(ﷺ النبي وقف) - මෙම ස්ථානවල **නබි මුහම්මද්** ﷺ තුමාණන් නවතා පාරායනය කර ඇත්තාහ.

ශුද්ධ අල් කුර්ආනය මුද්‍රණ කිරීම

මුද්‍රණ යන්ත්‍රය සොයා ගන්නට පෙර **අල් කුර්ආනය** පිටපත් කරන ලද්දේ අතින්ය. මේ සඳහා තම මුළු කාලයම කැප කළ පිරිසක් එකල සිටියහ. **අල් කුර්ආනය** අතින් පිටපත් කිරීම පිළිබඳ ඉතිහාසය ඉතා රසවත් එකක් වන අතර එය වෙනම ග්‍රන්ථයකට සෑහෙන රසබර වෘත්තාන්තයකි. මෙය එය විස්තර කිරීම සඳහා වන අවස්ථාව නොවේ.

හිජ්රි 1113 වසරෙහි මුද්‍රණ යන්ත්‍රය සොයා ගත් වකවානුවෙහි හැම්බර්ග් නගරයෙහි මුද්‍රණය කරන ලද පළමු **අල් කුර්ආනය දාර් අල් කුතුබ් මිස්රිය්යා** පුස්තකාලයෙහි අදත් සංරක්ෂණය කර තිබේ. එයින් පසු අපරදිග **අල් කුර්ආන්** පිටපත් කිහිපයක්ම මුද්‍රණය කරන ලද නමුත් එයට මුස්ලිම් ලෝකයෙහි වැඩි පිළිගැනීමක් ලැබුනේ නැත. එයින් පසු ක්‍රිව 1787 රුසියානු නගරයක් වන ශාන්ත පීටර්ස්බර්ග්හි **මව්ලේ උස්මාන්** තුමන් **අල් කුර්ආනය** මුද්‍රණය කරන ලද අතර පසුව තවත් **අල් කුර්ආන්** පිටපතක් **කාසාන්**හි මුද්‍රණය කරන ලදී. එයින් පසු ක්‍රිව 1828 ඉරානයේ තෙහෙරාන් නගරයෙහි ගල් ලෑලිවල ලිතෝග්‍රැෆි තාක්ෂණයෙන් **අල් කුර්ආන්** පිටපත් මුද්‍රණය කරන ලදුව මුද්‍රිත **අල් කුර්ආනය** ලොව පුරා ප්‍රචලිත විය. (**තාරිකුල් කුර්ආන්** පි : 186, **උලූමුල් කුර්ආන් සුබ්හි සාලිහ්**, උර්දු පරිවර්තනය **ගුලාම් අහ්මද් අල් හරීරි** පිටුව : 142)



وقفه : At this sign of ***waqfah***, one must stop a little longer than *saktah* (pause). But, breath should not break here too.

ق : This letter ***qāf*** is an abbreviation of *qīla 'alaihi l'waqf*. It means that some phoneticans of the Qur'ān identify a stop here while others do not.

قف : This word is '***qif*** which means 'stop' and it is inserted where the reader may possibly think that a stop was not correct there.

صلى : This is an abbreviation of ***al-waṣlu awlā*** which means 'it is better to recite in assimilated continuity'.

صل : This is an abbreviation of ***qad yuṣalū***, that is, some stop here, while others like to recite on in assimilated continuity.

وقف النّبى صلى الله عليه وسلم : This is marked at places where some *ḥadith* report proves that the Holy Prophet صلى الله عليه وسلم stopped here while reciting.

The printing of the Holy Qur'ān

Before the advent of the printing press, all copies of the Qur'ān were calligraphed by hand, and for this purpose, there always has been, in every age, a large group of calligraphers whose sole purpose in life was nothing else except the calligraphy of the Qur'ān. The amount of hard work put in by Muslims in writing the words of the Qur'ān in ever better styles, and the way they demonstrated their intense emotional involvement with this great Book has a long and interesting history of its own which would need a regular book. This is not the appropriate place to go in such details.

With the invention of the printing press, the noble Qur'ān was first printed at Hamburg in 1113 Hijrah, a copy of which is still present in Dār al-Kutub al-Misıīyyah. After that, several orientalists arranged the publication of the copies of Qur'an but they were not received with much approval in the Muslim world. After that, Mawlay 'Uthmān was the first person among Muslims who had one manuscript of the Qur'ān printed at St. Petersburg, a Russian city, in 1787 A.D. Similarly, another manuscript was printed in Qazān also. In 1828 A.D., the Qur'ān was printed by lithography on stone slabs in the Iranian city of Tehran. After that, printed copies of the Qur'ān became common throughout the world. (Tarikh al-Qur'ān by al-Kurdi, p. 186, and 'Ulum al-Qur'ān by Dr. Subhi Saleh; Urdu Translation by Ghulam Ahmad Hariri, p. 142)



02

سورة البقرة

සූරා අල් බකරා

(එළදෙන)



Sūrah Al-Baqarah 2

سُورَةُ الْبَقَرَة

SŪRAH AL-BAQARAH

(The Cow)


The Meanings Of The
NOBLE QUR'AN
with explanatory notes
by
Mufti Muhammad Taqi Usmani

හැඳින්වීම

අල් කුර්ආනයේ දීර්ඝතම **සූරාව*** මෙම **සූරාවයි.** මෙම **සූරාවේ** සිරස්තලය **'අල් බකරා'** හෙවත් 'එළදෙන' වශයෙන් නම් කර ඇත්තේ 67 සිට 73 වැනි **ආයතයන්හි** සඳහන් වී ඇති එළදෙනකගේ වෘත්තාන්තය පදනම් කරගෙනය. මෙහි ආරම්භක **ආයතයන්** වලින් විස්තර වන්නේ විශ්වාසිකයින් ප්‍රතික්ෂේපකයින් හා ආත්ම වංචනිකයින් පිළිබඳවය. ඉන් පසුව එය විශ්වාසය පිළිබඳ වූ මූල ධර්මයන් වන **අල්ලාහ්ගේ** ඒකීයත්වය, **නබි මුහම්මද්*** ﷺ තුමාගේ **නබිත්වය** හා මරණින් මතු ජීවිතය පිළිබඳ වූ කරුණු විග්‍රහ කිරීමක යෙදෙයි. තවද **නබි ආදම්*** عليه السلام තුමාණන්ගේ නිර්මාණය හා මිහිතලය මතට බලතල පැවරූ මිනිස් නියෝජිතයෙකු වශයෙන් එතුමාගේ පැමිණීම විග්‍රහ කොට ඇත්තේ මිනිසාට තමන්ගේ ආරම්භය පිළිබඳව මෙනෙහි කිරීම පිණිසය. ඉන් පසුව යුදෙව් ජනයා වෙත **අල්ලාහ්** විසින් ප්‍රදානය කරනු ලැබූ අනුග්‍රහයන් විස්තර කරමින් ඔවුන්ව ඉස්ලාමය වෙත ආරාධනය කිරීම අරමුණු කර ගත් කරුණු සහිත විශාල ඡේදයක් වෙන් කොට ඇත. මෙම සන්දර්භය තුළ **නබි මූසා*** عليه السلام තුමාණන් මුහුණ දුන් විවිධ අවස්ථා හා එතුමාට එරෙහිව **ඉස්රාඊල්** ජනයා* විසින් කරන ලද දුර්දාන්ත ක්‍රියා පිළිබඳව විස්තරයක් ඇතුළත් කොට ඇත. එයට පසු යුදෙව්වන් කිතුනුවන් හා මිථ්‍යාදෘෂ්ටික අරාබිවරුන් අතර පොදුතාවක් තිබූ **නබි ඉබ්රාහීම්*** عليه السلام තුමාණන් පිළිබඳව ද සඳහන් වේ. තවද විවිධ නැමදුම් පිළිබඳව මෙන්ම පවුල් සංස්ථාවට හා මූල්‍යය ගනු දෙනු ආදියට අදාළ වූ ඉස්ලාමීය නියෝගයන් හා උපදෙස් පිළිබඳව වූ විග්‍රහයන් ඉන් පසුව සඳහන් කොට ඇත.





Introduction

This is the largest *Sūrah* in the Holy Qur'ān. It is named after the story of the cow mentioned in verses 67 to73 of this *Sūrah*. The *Sūrah* starts with the mention of three categories of mankind: the believers, the unbelievers and the hypocrites. Then it deals with the fundamental articles of faith, namely, belief in the Oneness of Allah, the Messengership of the Holy Prophet ﷺ and the Life after death. The creation of 'Ādam (Adam) عليه السلام and his descent to earth has been narrated to make one recall his origin. Then, a large passage is devoted to inviting the Jews towards Islam by referring to many favours Allah has bestowed on them. Different parts of the life of the Holy Prophet Mūsā (Moses) عليه السلام, and the rebellious attitude of the Israelites against him, have been mentioned in this context. Then the Holy Prophet Ibrāhīm عليه السلام has been referred to as a basis of common agreement between Christians, Jews and the Pagans of Arabia. Thereafter, a series of Islamic injunctions has been laid down relating to different forms of worship, family life and financial transactions.

02 සූරා අල් බකරා (එළදෙන)

මෙය මක්කී පරිච්ඡේදයකි. ආයතයන් 286 කි.

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ﴿﴾

الٓمّٓ ﴿١﴾ ذٰلِكَ الْكِتٰبُ لَا رَيْبَ ۛ فِيْهِ ۛ هُدًى لِّلْمُتَّقِيْنَ ﴿٢﴾ الَّذِيْنَ يُؤْمِنُوْنَ بِالْغَيْبِ وَ
يُقِيْمُوْنَ الصَّلٰوةَ وَ مِمَّا رَزَقْنٰهُمْ يُنْفِقُوْنَ ﴿٣﴾ وَالَّذِيْنَ يُؤْمِنُوْنَ بِمَآ اُنْزِلَ اِلَيْكَ وَمَآ اُنْزِلَ
مِنْ قَبْلِكَ ۚ وَبِالْاٰخِرَةِ هُمْ يُوْقِنُوْنَ ﴿٤﴾

සැමට කරුණාභරිත පරම කරුණාභරිත **අල්ලාහ්**ගේ නාමයෙන් ආරම්භ කරමි.

(1) **අලිෆ් ලාම් මීම්**[1]. (2) මෙම ධර්ම පුස්තකය, එහි (කිසිඳු) සැකයක් නොමැත. බිය භක්තිකයින්ට මග පෙන්වන්නකි. (3) ඔවුන් කවරහුද යත් ගුප්ත දෑ[2] විශ්වාස කරන, තවද **සලාතය***[3] ස්ථිරවම ඉටුකරන, තවද ඔවුනට අප දුන් දැයින් වියදම් කරන අය වෙති.[4] (4) (**නබිවරය**,) තවද ඔවුන් නුඹට පහළ කරනු ලැබූ දෑ(**අල් කුර්ආනය**) හා නුඹට පෙර පහළ කරනු ලැබූ දෑ[5] විශ්වාස කරන අය ද වෙති. තවද ඔවුහු මතුලොව[6] පිළිබඳව තරයේ විශ්වාස කරති.-

---

1) මෙය අරාබි අක්ෂරයන් තුනක්ය. මෙවැනි අක්ෂරයන් **සූරා**වන් 29ක ආරම්භයේ ඇති අතර එහි නිවැරදි අර්ථය **අල්ලාහ්** පමණක් දනී. මෙම අක්ෂරයන් **‘අල් හුරූෆුල් මුකත්තආත්’** යනුවෙන් හැඳින් වේ. මෙහි අර්ථය අප නොදැන සිටීම **අල්ලාහ්** කෙරෙහි වූ විශ්වාසයට හෝ ඔහුට නැමදුම් කිරීමට කිසිදු බලපෑමක් ඇති නොකරයි.

2) පංචේන්ද්‍රියන්ට ගෝචර නොවන පාරභෞතික දෑ එනම් **අල්ලාහ්, මලක්**වරුන්*(දේව දූතයින්), ස්වර්ගය හා නිරය වැනි දෑය.

3) **අල් කුර්ආනයේ සලාතය*** යන වචනය මුස්ලිම්වරුන් දෛනිකව පස් වේලක් අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු නැමදුම පෙන්නුම් කරයි.

4) එනම් **zසකාතය*** වැනි අනිවාර්යය වන හා **සදකා*** වැනි අනිවාර්යය නොවන සියලු පුන්‍යශීලී දන්දීම් මෙයින් අදහස් කෙරේ.

5) එනම් **නබි මුහම්මද්*** ﷺ තුමාණන්ට පෙර පැමිණි **රසූල්**වරුන්ට* පහළ කරන ලද **තව්රාත්*** **ඉන්ජීල්*** හා **zසබූර්*** යන ධර්ම පුස්තක වේ. එම ධර්ම පුස්තක වර්තමානයේ විකෘති වීම් වලට භාජන වී ඇති අතර මින් අදහස් වන්නේ නිවැරදි හා සත්‍යය ධර්ම පුස්තකයන් පිළිබඳව පමණි. තවද මෙම ධර්ම පුස්තකයන් අතුරින් ඇතැම් ධර්ම පුස්තකයන් වෙනස් කරනු ලැබ ඇති බව **අල් කුර්ආන්** 4:46 හා 5:13 යන **ආයතයන්හි** ද සඳහන් වී ඇත.

6) මෙහි ‘මතුලොව’ යන වචනයට භාවිත වී ඇති අරාබි පදය වනුයේ ‘الْأٰخِرَة (**අල් ආහිරා**)’ යන පදයය. එම පදයට ‘මතුලොව’ හා ‘අවසානයා’ යන අරුත ගෙන දේ. නමුත් මෙම **ආයතයෙහි** සඳහන් මෙම පදයට ‘මතුලොව’ යන අර්ථය මිස වෙනත් කිසිදු අර්ථයක් දිය නොහැක.



7 Sūrah Al-Baqrah 2: 1-4

آياتها ٢٨٦ ۞ ٢ سُوْرَةُ الْبَقَرَةِ مَدَنِيَّةٌ ٨٧ ۞ ركوعاتها ٤٠

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ○

الٓمّٓ ○ ذٰلِكَ الْكِتٰبُ لَا رَيْبَ ۛ فِيْهِ ۛ هُدًى لِّلْمُتَّقِيْنَ ○ الَّذِيْنَ يُؤْمِنُوْنَ معانقة
بِالْغَيْبِ وَ يُقِيْمُوْنَ الصَّلٰوةَ وَ مِمَّا رَزَقْنٰهُمْ يُنْفِقُوْنَ ○ وَ الَّذِيْنَ يُؤْمِنُوْنَ بِمَآ
اُنْزِلَ اِلَيْكَ وَ مَآ اُنْزِلَ مِنْ قَبْلِكَ ۚ وَ بِالْاٰخِرَةِ هُمْ يُوْقِنُوْنَ ○

SŪRAH AL-BAQARAH

(The Cow)

This *Sūrah* is *Madanī*, and comprises 286 *'āyāt* (verses)

With the name of Allah, the All-Merciful, the Very-Merciful.

Alif. Lām. Mīm.(1) [1] **This Book has no doubt in it - a guidance for the God-fearing,** [2] **who believe in the Unseen,**(2) **and are steadfast in Ṣalāh (prayer),**(3) **and spend**(4) **out of what We have provided them;** [3] **and who believe in what has been revealed to you and what has been revealed before you;**(5) **and they have faith in the Hereafter.** [4]

---

(1) These isolated letters found in the beginning of different *Sūrahs* are called *Al-Ḥurūf-ul-Muqaṭṭa'āt*. The correct position about them is that their exact meanings are not known to anybody. It is a divine secret that may be disclosed only by Allah in the Hereafter. Since no practical issue depends on their knowledge, our ignorance about them does not have any adverse effect on our faith or practice.

(2) 'Unseen' is the translation of *ghaib*, a term frequently used by the Holy Qur'ān. It refers to all those realities that cannot be seen or felt by our outer senses, like Allah the Almighty, the angels, the Paradise, the Hell etc.

(3) *Ṣalāh* (prayer) is the Qur'ānic name of the obligatory prayer prescribed to be offered five times a day.

(4) Although the word 'spend' is general for any spending, the Holy Qur'ān normally uses this word in the sense of 'charitable spending', including obligatory alms termed in Sharī'ah as *Zakāh*.

(5) It refers to the divine books or scriptures revealed to the earlier prophets عليهم السلام, like Torah, Injīl and Zabūr (Psalm). It should be noted that having belief in these books means that whatever was originally revealed in those books was the truth.